# ගම්පහ වික්‍රමාරච්චි
# දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

# கம்பஹா விக்ரமாராச்சி
# சுதேச மருத்துவப் பல்கலைக்கழகம்

# GAMPAHA WICKRAMARACHCHI
# UNIVERSITY OF INDIGENOUS MEDICINE

## වාර්ෂික වාර්තාව හා ගිණුම්

## ஆண்டறிக்கையும்  கணக்கும்

## ANNUAL REPORT & ACCOUNTS

## 2021

# දැක්ම

**දේශීය වෛද්‍ය ක්‍රමය සහ සේවා පිළිබඳ අධ්‍යාපනය සහ පර්යේෂණ සම්බන්ධයෙන් විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම**

# මෙහෙවර

**ජාතික සහ ගෝලීය අවශ්‍යතාවන් සපුරාලන දැනුමින්, කුසලතා සහ ආකල්පවලින් පොහොසත් වෘත්තිකයින් බිහි කිරීම පිණිස දේශීය වෛද්‍ය ක්‍රමය සහ විද්‍යා පිළිබඳ ඉහළ ගුණාත්මකභාවයකින් යුත් ඉගෙනුම් පරිසරයක් සැලසීම සහ නවීන පර්යේෂණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම**

# උපකුලපතිතුමාගේ සමාලෝචනය



ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 2021 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම මාගේ ඉමහත් ප්‍රීතියට කරුණකි. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යායතනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂයපථය යටතේ දිවයිනේ 16 වැනි ජාතික විශ්වවිද්‍යාලය බවට උසස් කළ බැවින් 2021 වර්ෂය අප විශ්වවිද්‍යාලය සඳහා අද්විතීය වර්ෂයක් බවට එහි උපකුලපති වශයෙන් මා ප්‍රකාශ කරන්නට කැමැත්තෙමි.

වර්ෂ 1929 දී ආයුර්වේද චක්‍රවර්ති පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි මැතිතුමා විසින් සිද්ධායුර්වේද වෛද්‍ය ක්‍රමය ඉගෙනුම් මධ්‍යස්ථානයක් ලෙස ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය ස්ථාපිත කරනු ලැබීය. පළමු ශිෂ්‍ය කන්ඩායමට ශිෂ්‍යයින් 20 දෙනෙක් ඇතුළත් විය. 1995 වර්ෂයේ දී එම විද්‍යාලය කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ විශ්වවිද්‍යාල ආයතනයක් ලෙස උසස් කරන ලදී.

2020.10.28 දිනැති අංක 2199/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් 2021.03.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යායතනය "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" නමින් විශ්වවිද්‍යාලය තත්ත්වයට උසස් කරන ලදී. නව විශ්වවිද්‍යාලයේ පීඨ හතරකි. ඒවා නම්, දේශීය වෛද්‍ය විද්‍යා පීඨය, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය, දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයයි. ඉහත පීඨවලට අධ්‍යයන අංශ 13ක් ඇතුළත් වන අතර එම පීඨ මඟින් ප්‍රථම උපාධි වැඩසටහන් 11ක් පමණ සහ පශ්චාත් උපාධි පාඨමාලා 09ක් පිරිනමනු ලබයි. විශ්වවිද්‍යාලය 2020 වර්ෂයේ උසස් පෙළ ප්‍රතිඵල මත පදනම්ව ප්‍රථම උපාධි මට්ටම සඳහා ශිෂ්‍යයින් 600ක් පමණ ඇතුළත් කරවා ගැනීමට යෝජනා කරන ලද අතර මෙම ශිෂ්‍ය බඳවා ගැනීම ක්‍රමයෙන් වැඩි කරනු ඇත.

**ජයග්‍රහණ**

- වර්තමාන විද්‍යායතනය 2021.03.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" නමින් විශ්වවිද්‍යාලය තත්ත්වයට උසස් කිරීම පිණිස 2020.10.28 දිනැති අංක 2199/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය
- ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ විශ්වවිද්‍යාලයේ පළමු වැනි උපකුලපති ලෙස පත් කරන ලදී
- බී. ඒ. එන්. ක්‍රිෂාන්ත මහතා විශ්වවිද්‍යාලයේ පළමු වැනි ලේඛකාධිකාරී ලෙස පත් කිරීම
- ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය සියලු පහසුකම් සහිත විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීම සනිටුහන් කරමින් පවත්වන ලද නිල උත්සවය ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2021.03.04 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලදී.
- දේශීය වෛද්‍ය විද්‍යා පීඨය, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය, දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය යන පීඨ හතර පිහිටුවීම.

- දේශීය වෛද්‍ය විද්‍යා පීඨය, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය, දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය යන පීඨ හතර සඳහා පීඨාධිපතිවරු පත් කරන ලද අතර ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය බඳවා ගන්නා ලදී.

- විශ්වවිද්‍යාලයේ පාලක සභාව සහ සෙනෙට් සභාව ස්ථාපිත කරන ලදී.

- විශ්වවිද්‍යාලයේ පරිපාලන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කරන ලදී.

- විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ කරන ලදී.

- වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සඳහා වූ මධ්‍යස්ථානය (CGEE), සමාජ සංහිඳියා මධ්‍යස්ථානය (SRC), තත්ත්ව සහතික මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම.

- විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම සහ සංවර්ධනය වේගවත් කිරීම (AHEAD) ව්‍යාපෘතියේ මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම.

- අලුතින් බඳවාගත් ශාස්ත්‍රීය කාර්ය මණ්ඩලය සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන පාඨමාලාව පැවැත්වීම

- 2021 දෙසැම්බර් මස 21 සහ 22 දිනවල දී විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළුවක් පවත්වන ලදී.

- "විකුම් උයන" ඇවිදීමේ මංතීරු ව්‍යාපෘතිය 2021 මැයි මස 28 වැනි දින ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර පිරිවැය රුපියල් මිලියන 70ක් වන අතර නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මෙම ව්‍යාපෘතිය මෙහෙයවනු ලබයි. මෙම ව්‍යාපෘතියට ඔසු උයනක්, ගිමන් ප්‍රදේශයක් සහ වාහන ධාවන කළ හැකි අලෙවි ප්‍රදේශයක් ඇතුළත් වේ.

- අලුතින් ස්ථාපනය කළ විශ්වවිද්‍යාලයේ පාරිසරික අලංකරණය වැඩිදියුණු කිරීම පිණිස තණ පිඩලි ඇල්ලීම, නැවත පිරවීම, බිම් ඇතුරුම් ගල් ඇල්ලීම, රැඳවුම් බිත්තිය සහ ආරක්ෂක වැට යනා දී වැඩකටයුතු සම්පූර්ණ කිරීම

- විශ්වවිද්‍යාලයේ පරිපාලන කාර්යයන්ට පහසුකම් සැලසීම පිණිස 2021 වර්ෂය වන විට නව පර්පාලන ගොඩනැගිල්ලේ කටයුතු නිමා කිරීම

- අලුතින් ස්ථාපිත කරන ලද දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය සඳහා යටිතලපහසුකම් සැලසීම පිණිස 2022 වර්ෂයේ දී මහල් හතරකින් යුත් පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය (AC2) සම්පූර්ණ කිරීම.

- දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳ හදාරන ශිෂ්‍යයින්ගේ ප්‍රායෝගික පරීක්ෂණ සහ කාර්ය මණ්ඩල සංවර්ධනය යනා දී කටයුතුවලට ලබා දී ඇති පහසුකම් ඉහළ නැංවීම පිණිස 2022 වර්ෂයේ දී පුස්තකාල ගොඩනැගිල්ලේ පිහිටි විදුලි වැඩපොළ සහ ඇලුමිනියම් ග්‍රිල් වැඩ එකතු කිරීම සහ වෙනස් කිරීම පිළිබඳ පුනරුත්ථාපනය ව්‍යාපෘති නිමා කිරීම, වතුපිටිවල පිහිටි ඔසු උයන නවීකරණය කිරීම.

## විශ්වවිද්‍යාලයේ විශේෂ අවස්ථාවන්

- ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය විවෘත කිරීමේ උත්සවය - **2021.03.01**



- විශ්වවිද්‍යාලයේ පළමු උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ සහ විශ්වවිද්‍යාලයේ පළමු ලේඛකාධිකාරී බී. ඒ. එන්. ක්‍රිෂාන්ත **2021.03.01** වැනි දින සිය ධූරවල වැඩ භාරගන්නා ලදී.





- ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත්වීමේ සමාරම්භක උත්සවය - **2021.03.04** වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී



- විකුම් උයන සමාරම්භක උත්සවයට - **2021.05.28**



- වැඩබලන උපකුලපති මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න සිය ධූරයේ වැඩ භාරගැනීම - **2021.10.01**



- **2021** දෙසැම්බර් මස **21** සහ **22** දිනවල දී අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළුවක් පවත්වන ලදී



**අනාගත සැලසුම්**

1. ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි වැඩසටහනේ (BAMS) විෂයමාලාව විධිමත්
2. "ඉගෙනුම අතර වැඩ කිරීම" (Work while Learning) සංකල්පය ක්‍රියාත්මක කිරීම. ශිෂ්‍යයින්ට රජයේ සහ පෞද්ගලික ආයතනවලින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට උපකාර වනු පිණිස විශ්වවිද්‍යාලය මඟින් එම ආයතන සමඟ සාකච්ඡා කර ඇත.
3. රැකියා කළ හැකි උපාධිධාරීන් බිහි කිරීම. සියලුම ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා 21වැනි සියවසේ නිපුණතා, කළමනාකරණ කුසලතා, මානව සම්පත් නිපුණතා ආදිය ප්‍රධාන විෂයමාලාව තුළින් ලබා ගැනීම පිණිස සියලුම උපාධි අපේක්ෂකයින් සඳහා පාඨමාලා මොඩියුල හඳුන්වාදීමට තීරණය කර ඇත.
4. අධ්‍යයන අංශ ස්ථාපිත කිරීම. විශ්වවිද්‍යාලය එහි ප්‍රායෝගික ක්‍රියාත්මක කිරීමේ ක්ෂේත්‍ර සම්බපන්ධයෙන් එහි අධ්‍යයන අංශ පිහිටුවීමට අපේක්ෂා කරයි.
5. "විකුම් උයන" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. අපි මෙම ව්‍යාපෘතිය සාමාජීය ව්‍යාපෘතියක් ලෙස කළමනාකරණය කිරීමට අපේක්ෂා කරන්නෙමු.
6. වතුපිටිවල ඔසු උයන සංවර්ධනය කිරීම. මෙම භූමිය සාම්ප්‍රදායක ආයුර්වේද කෞතුකාගාරයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන්නෙමු.
7. විවිෂ විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් නව පාඨමාලා හඳුන්වා දීම.
8. පශ්චාත්-උපාධි පාඨමාලා විධිමත් කිරීම

**මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න**

**වැඩබලන උපකුලපති**

# පටුන


දැක්ම ........................................................................................................................ i

මෙහෙවර ........................................................................................................................ i

උපකුලපතිතුමාගේ සමාලෝචනය ........................................................................................ ii

1. හැඳින්වීම – ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ........................................ 1

    1.1 නව විශ්වවිද්‍යාලයේ පැවරුම් බලය ........................................................................ 2

    1.2 විශ්වවිද්‍යාලයේ සන්ධිස්ථාන ..................................................................................... 3

2. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ අභිමතාර්ථ ........................................4

3. විශ්වවිද්‍යාලයේ සාරධර්ම ............................................................................................ 5

4. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය ................................ 6

5. පාලක සභාවේ සාමාජිකයින් – 2021.............................................................................. 7

6. විශ්වවිද්‍යාලයේ නිලධාරීන් – 2021.................................................................................. 8

7. පීඨ සහ අධ්‍යයන අංශ ..................................................................................................... 9

8. පීඨ පිරිනමන ප්‍රථම උපාධි වැඩසටහන් ........................................................................ 10

9. විශ්වවිද්‍යාලය පිරිනමන පශ්චාත්-උපාධි වැඩසටහන් ...................................................... 10

10. විශ්වවිද්‍යාලය පිරිනමන බාහිර පාඨමාලා .................................................................... 10

11. ආරම්භ කළ නව පාඨමාලා පිළිබඳ විස්තර – 2021.......................................................... 11

12. දේශීය ශිෂ්‍යයින් පිළිබඳ විස්තර – 2021 ...................................................................... 11

13. 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍යයින්ගේ විස්තර................................................. 11

14. උපාධිධාරී නිමැවුම – 2021 ......................................................................................... 12

15. පශ්චාත්-උපාධි නිමැවුම – 2021 ................................................................................... 12

16. මානව සම්පත් සහ ශිෂ්‍යයින් පිළිබඳ විස්තර – 2021 ...................................................... 12

17. ශිෂ්‍ය කටයුතු

    17.1. ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් – 2021 ........................ 14

    17.2. ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව – 2021 ............................................ 14

18. මානව සම්පත්

    18.1. 2021.12.31 දිනට සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය, විධායක කාර්ය මණ්ඩලය, පුස්තකාල කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ........................................................................................ 16

19. පර්යේෂණ සහ සංවර්ධනය

    19.1. පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර............................................ 18

    19.2. ලැබූ සම්මාන පිළිබඳ විස්තර ................................................................................ 19

20. වෙනත් ඒකක සහ මධ්‍යස්ථාන

20.1. පුස්තකාලය ............................................................................................. 21
20.2. ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය ............................................................... 23
20.3. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය ................................................................... 25
20.4. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය ........................................................ 25
20.5. වෛද්‍ය මධ්‍යස්ථානය ...................................................................................... 27
20.6. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය ........................................ 27
20.7. මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය ......................................... 28
20.8. ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය (CGEE) .................................. 31
20.9. සමාජ සංහිඳියා මධ්‍යස්ථානය (SRC) ............................................................ 32
20.10. තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය ................................................................... 32

21. ගිණුම් – 2021

21.1. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර .............................................................. 35
21.2. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර ...................................................................... 35
21.3. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම) ............................................................. 35
21.4. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම) ........................................... 35
21.5. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2021 ........................................................... 36
21.6. පීඨය අනුව එක් ශිෂ්‍යයෙක් සඳහා පිරිවැය 2017-2021 ...................................... 36
21.7. 2021 දී යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විස්තර ........................... 36

22. මූල්‍ය ප්‍රකාශන – 2021 ........................................................................................ 38

23. 2021 තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම් වූ අනාගත අපේක්ෂාවන් පිළිබඳ වාර්තාව2021 ...... 58

24. විගණකාධිපති වාර්තාව – 2021 ............................................................................ 62

25. 2021 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවට පිළිතුරු 2021 .................................... 70

# කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| GWUIM | - | ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය |
| FIM | - | දේශීය වෛද්‍ය පීඨය |
| FIHST | - | දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය පීඨය |
| FISSMS | - | දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය |
| FGS | - | පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය |
| SDC | - | කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය |
| ICTC | - | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය |
| CGU | - | වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය |
| CGEE | - | ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය |
| SRC | - | සමාජ සංහිඳියා මධ්‍යස්ථානය |
| CQA | - | තත්ත්ව සහතික මධ්‍යස්ථානය |
| DR | - | නියෝජ්‍ය ලේඛකාධිකාරී |
| SAR | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී |
| SAL | - | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති |
| SAIA | - | ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක |
| AR | - | සහකාර ලේඛකාධිකාරී |
| AB | - | සහකාර මූල්‍යාධිකාරී |

# 1. හැඳින්වීම – ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය



විශ්වවිද්‍යාලය කොළඹින් කිලෝ මීටර 30ක් පමණ දුරින් කොළඹ - නුවර මාර්ගයේ යක්කල ප්‍රදේශයේ පිහිටා ඇත. හිටපු ආයුර්වේද චක්‍රවර්තී පණ්ඩිත ගේබ්‍රියල් පෙරේරා වික්‍රමාරච්චි ශ්‍රීමතාණන් විසින් සාම්ප්‍රදායක වෛද්‍යවරුන් හට ඔසු ඖෂධ සකස් කිරීම සහ චිකිත්සාව ඇතුළු අෂ්ඨාංග ආයුර්වේදය පිළිබඳ දැනුම සහ නිපුණතා ලබාදීම පිණිස යක්කල පිහිටි තම පෞද්ගලික ඉඩමේ ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය ලෙස මෙම ආයතනය ස්ථාපනය කිරීම සමඟ මෙම ආයතනය ආරම්භ විය. ඖෂධ නිෂ්පාදන ඒකකයක්, රෝහලක් සහ දුර්ලභ පැළ එකතුවකින් සැඳුම්ලත් ඖෂධ උද්‍යානයක් ආයතනය ආරම්භක අවස්ථාවේ දී ආයතනය සතුවූ අගනි සම්පත් විය. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ නැඟී එන නව ප්‍රවණතා සහ එමගින් ජාතික සෞඛ්‍ය අංශයට දක්වන අති විශාල දායකත්වය හඳුනා ගනිමින් 1951 වර්ෂයේ දී විද්‍යාලය රාජ්‍ය පිළිගත ආයතනයක් බවට ප්‍රකාශ කරනු ලැබූවේ එකී ආයතනයෙන් පිරිනමන ඩිප්ලෝමාධාරීන්ට රාජ්‍ය අංශයේ ආයුර්වේද රෝහල්වල සේවයට සුදුසුකම් සපුරාලන වෘත්තිකයින් බවට පත් කරමිනි. 1982 වර්ෂයේ දී සම්මත කළ 1982 අංක 30 දරන පාර්ලිමේන්තු පනත මඟින් විද්‍යාලය දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය ලෙස සංස්ථාගත කරන ලදී. වර්ෂ 1995 පෙබරවාරි 23 වැනි දිනැති අංක 859/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් ආයතනය කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කිරීමත් සමඟ එය විශ්වවිද්‍යාල විද්‍යායතනයක තත්ත්වයට උත්ශ්‍රේණිගත කරන ලදී.

2020.07.08 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ‘‘සෞභාග්‍යයේ දැක්ම’’ ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ ගම්පහ දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීමට සමගාමීව යක්කල, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක තත්ත්වයට උසස් කිරීම සඳහා තීරණය කරන ලදින් වර්තමාන විද්‍යායතනය 2021.03.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" නමින් විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීම සඳහා වූ එකී නියෝගය 2020.10.28 දිනැති අංක 2199/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයෙන් නිකුත් කරන ලදී.

නව විශ්වවිද්‍යාලයට පීඨ හතරක් සහ අධ්‍යයන අංශ 13ක් ඇතුළත් වන අතර ප්‍රථම උපාධි වැඩසටහන් 08ක් සහ පශ්චාත් උපාධි පාඨමාලා 09ක් පිරිනමනු ලබයි. විශ්වවිද්‍යාලය 2020 වර්ෂයේ උසස් පෙළ ප්‍රතිඵල මත පදනම්ව ප්‍රථම උපාධි මට්ටම සඳහා ශිෂ්‍යයින් 600ක් පමණ ඇතුළත් කරවා ගැනීමට යෝජනා කරන ලද අතර මෙම ශිෂ්‍ය බඳවා ගැනීම ක්‍රමයෙන් වැඩි කරනු ඇත.

විශ්වවිද්‍යාලය දේශීය වෛද්‍ය පීඨය, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය පීඨය, දේශීය සමාජ විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය යන පීඨ හතරකින් සැදුම්ලත් වේ. මෙම පීඨවලට අධ්‍යයන අංශ 14ක් ඇතුළත් වේ. විශ්වවිද්‍යාලය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය

(BAMS) හැරුණු කොට 2021 වර්ෂයේ දී නව ප්‍රථම උපාධි පාඨමාලා හතක් ආරම්භ කිරීමටත් පසුව ක්‍රමයෙන් ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටම්වලට නව පාඨමාලා හඳුන්වා දීමට අපේක්ෂා කරයි.

නිර්මාතෘ පණ්ඩිත ජී පී වික්‍රමාරච්චි ශ්‍රීමතාණන්. ඔහු ඉටු කළ කාර්යභාරයට ඉතා පුළුල් පිළිගැනීමක් හිමි වූ අතර ඔහු ආයුර්වේද වෛද්‍යවරයෙක් සඳහා පිරිනමන ඉහළම ගෞරවය වන ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් පිරිනමන 'ආයුර්වේද චක්‍රවර්ති රාජ වෛද්‍ය' යන අභිධානය ප්‍රදානය කළ පළමු වැන්නා විය. (ඡායාරූපය සීමසහිත ගම්පහ වික්‍රමාරච්චි සිද්ධායුර්වේද ඖෂධ (පුද්ගලික) සමාගමෙන් ලබා ගන්නා ලදී).



## 1.1. නව විශ්වවිද්‍යාලයේ පැවරුම් බලය

"සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය විශ්වවිද්‍යාලයක තත්ත්වයට උසස් කිරීම ඉහළම ප්‍රමුඛතාව විය. ඒ අනුව, 2020 ජුලි 08 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී විද්‍යායතනය අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීමට තීරණය කරන ලදී. නව විශ්වවිද්‍යාලය 2020 ඔක්තෝබර් මස 28 දිනැති අංක 2199/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වැනි වගන්තිය යටතේ 2021 මාර්තු 01 වැනි දින සිට ස්ථාපනය කරනු ලැබූ අතර 2021 පෙබරවාරි මස 28 වැනි දින සිට 1995 පෙබරවාරි මස 23 දිනැති අංක 859/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් අවලංගු කරන ලදී.

දේශීය වෛද්‍ය විද්‍යා පිළිබඳ අධ්‍යයන ශාඛාවන් හි උසස් අධ්‍යාපනය ලබාදීම, දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සහ අනාගත ඉල්ලුම සපුරා ලිය හැකි එකී ක්ෂේත්‍රවල මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම නව විශ්වවිද්‍යාලයේ පැවරුම් බලය වේ. විශ්වවිද්‍යාලය සාම්ප්‍රදායක විශ්වවිද්‍යාලයක් ලෙස ක්‍රියාත්මක නොවේ. ඇතැම් උපාධි වැඩසටහන් පැවැත්වීම සහ නේවාසිකාගාර පහසුකම් සලසා ලනු පිණිස පෞද්ගලික රාජ්‍ය හවුල්කාරත්ව (PPP) වැඩසටහන් ඇති කර ගැනීමට විශ්වවිද්‍යාලය සැලසුම් කර ඇත. ශිෂ්‍යයින්ට කථිකාචාර්යවරුන්ගේ සහ කාර්මික විද්වතුන්ගේ අධීක්ෂණය යටතේ ආධුනිකයෙක් වශයෙන් වැඩ කරන අතරතුර ඔහු/ ඇය පන්ති කාමරය තුළ දී අත්කර ගන්නා න්‍යායාත්මක දැනුම සැබෑ ලෝකයට අදාළ කර ගැනීමට අවස්ථාව හිමි වන "ඉගෙනුම අතර වැඩ කිරීම" සංකල්පය ලෙස නව සංකල්පයක් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියට හඳුන්වා දීමට විශ්වවිද්‍යාලය අපේක්ෂා කරනු ලබයි.

### 1.2. විශ්වවිද්‍යාලයේ සන්ධිස්ථාන

**1929**
- .ආයුර්වේද චක්‍රවර්තී පණ්ඩිත ජී.පී. වික්‍රමාරච්චි ශ්‍රීමතාණන් විසින් 1929.07.19 වැනි දින ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය ආරම්භ කරන ලදී.

**1951**
- ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලයේ ඩිප්ලෝධාරීන්ට රජයේ ආයුර්වේද රෝහල්වල සේවය කළ හැකි පරිදි ආණ්ඩුව මඟින් ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය පිළිගැනීම

**1982**
- අංක 30 දරන පර්ලිමේන්තු පනත මඟින් ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය දේශීය වෛද්‍ය විද්‍යා අමාත්‍යාංශය යටතට ගැනීම.

**1995**
- 1995 පෙරවාරි 23 දිනැති අංක 859/12 මඟින් 1995.03.01 දින සිට බලාත්මක වන පරිදි විද්‍යාලය "ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය" කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කිරීම.

**1998**
- ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි වැඩසටහනේ (BAMS) 1වැනි ශිෂ්‍ය කණ්ඩායම ඇතුළත් කර ගැනීම (BAMS)

**2002**
- පශ්චාත් උපාධි වැඩසටහන් ආරම්භ කරන ලදී

**2018**
- ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි වැඩසටහන (BAMS) ඉන්දියානු වෛද්‍ය මධ්‍යම කවුන්සිලය (CCIM) මඟින් අනුමත කිරීම

**2021**
- 2020 ඔක්තෝබර් 28 දිනැති අංක 2199/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් 2021.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යායතනය "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" ලෙස උසස් කිරීම.

## 2. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ අභිමතාර්ථ

| | | |
|---|---|---|
| **01 වැනි ඉලක්කය** | - | දේශීය වෛද්‍ය අධ්‍යාපනය වැඩිදියුණු කිරීමට විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීම |
| **02 වැනි ඉලක්කය** | - | දේශීය වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හරහා ඒ පිළිබඳ රාජ්‍ය උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ඉහළ නැංවීම |
| **03 වැනි ඉලක්කය** | - | දේශීය වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මක පර්යේෂණ සහ නවෝත්පාදනය හරහා ශාස්ත්‍රීය විශිෂ්ටත්වය වැඩිදියුණු කිරීම |
| **04 වැනි ඉලක්කය** | - | ඉහළ ගුණාත්මක, කාර්යක්ෂම මානව ප්‍රාග්ධනය සමඟ විශ්වවිද්‍යාලය වැඩිදියුණු කිරීම |
| **05 වැනි ඉලක්කය** | - | ශක්තිජනක නිපුණතා උපාධිධාරියෙකු බිහි කිරීම |
| **06 වැනි ඉලක්කය** | - | කාර්යක්ෂම සහ ඵලදායී කළමනාකරණ සංස්කෘතියක් අත්කර ගැනීම පිණිස ආරක්ෂිත සහ ස්ථාවර පද්ධති හරහා විශ්වවිද්‍යාලයේ පාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම |

## 3. විශ්වවිද්‍යාලයේ සාරධර්ම

විශ්වවිද්‍යාලයේ සාරධර්ම ආයතනය විශ්වාස කරන්නේ කුමක් ද සහ එකිනෙකා සමඟ සහ ගණුදෙනුකරුවන්, සැපයුම්කරුවන් සහ උනන්දුවක් දක්වන වෙනත් පාර්ශ්වකරුවන් සමඟ ආයතනයේ සිටින තැනැත්තන් කෙසේ හැසිරිය යුතු ද යන්න නිර්වචනය කරයි.

විශ්වවිද්‍යාලයේ සාරධර්ම හතර පහත දැක්වෙන පරිදි වේ:

### 1. අවංකභාවය (Integrity)

අපට අවංකභාවය සහ විශ්වාසනීයත්වය හරහා උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය දිනා ගත හැකි බවට අපි විශ්වාස කරන්නෙමු

### 2. අභිප්‍රේරණය (Motivation)


අපි අභිප්‍රේරණය හරහා විශිෂ්ටත්වය කරා ගමන් කරන්නෙමු

### 3. නවෝත්පාදනය (Innovation)


අපි නව මංපෙත් විවර කර ගැනීම සඳහා නවෝත්පාදනය සහ නිර්මාණශීලීත්වය හරහා නව දැනුම උත්පාදනය කරන්නෙමු

### 4. ගරු කිරීම (Respect)

අපි කණ්ඩායම් වැඩ සහ එකිනෙකා සඳහා ගෞරවය ඇති කරවන සාමූහික පරිසරයක් තුළින් සාරධර්ම අත්කර ගන්නෙමු



# 4. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය



## 5. පාලක සභාවේ සාමාජිකයින් – 2021

උපකුලපති

i. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මහත්මිය - 01.03.2021 - 30.09.2021

ii. මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න මහතා - 01.10.2021 - සිට මේ දක්වා

**පීඨාධිපතිවරු**

i. පීඨාධිපති - දේශීය වෛද්‍ය විද්‍යා පීඨය

    a. ආචාර්ය එච්. පී. චක්කුඹුර - 01.03.2021 - 24.09.2021

    b. ආචාර්ය ඩබ්ලිව්. එම්. බී. වීරසූරිය - 28.09.2021 - 22.12.2021

    c. ආචාර්ය ඩබ්ලිව්. ජේ. වික්‍රමාරච්චි - 23.12.2021 - සිට මේ දක්වා

ii. පීඨාධිපති - දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය

    a. ආචාර්ය ඩබ්ලිව්. එම්. බී. වීරසූරිය - 01.03.2021 - 27.09.2021

    b. ආචාර්ය එන්. ටී. බී. මධුශංක - 29.09.2021 - සිට මේ දක්වා

iii. පීඨාධිපති - දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය

    a. වෛද්‍ය කේ. ජී. සී. දිසානායක - 01.03.2021 - 27.09.2021

    b. ආචාර්ය ජී. කේ. ජයතිලක - 01.10.2021 - සිට මේ දක්වා

iv. පීඨාධිපති - පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

    a. ආචාර්ය ඩබ්ලිව්. ඒ. එල්. චන්ද්‍රසිරි වැලිවිට - 01.03.2021 - සිට මේ දක්වා

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත් කළ සාමාජිකයන්**

i. මහාචාර්ය හරිස්චන්ද්‍ර අබේගුණවර්ධන

ii. වෛද්‍ය එච්. ධර්මවිජය

iii. සිරිමල් සේනාරත්න මහතා

iv. වෛද්‍ය පී. ඩබ්ලිව්. ඩබ්ලිව්. දිසානායක

v. ප්‍රශාන්ත ලාල් ද අල්විස් මහතා

vi. සුනිල් ජයලත් මහතා

vii. ගීතා කරදවල මහත්මිය

viii. ජයලත් වැල්ලවත්ත මහතා

**සෙනෙට් සභා නාමික නිලධරයන්**

i. වෛද්‍ය රේණුක හේවගේ

ii. වෛද්‍ය ශාලිකා පතිරත්න

**ලේඛකාධිකාරී (ලේකම්)**

බී. ඒ. එන්. ක්‍රිශාන්ත මහතා

## 6. විශ්වවිද්‍යාලයේ නිලධාරීන් – 2021

**කුලපති**

මල්වතු පාර්ශ්වයේ අති පූජ්‍ය සාහිත්‍ය චක්‍රවර්ති, ආචාර්ය නියන්ගොඩ ධර්මකීර්ති ශ්‍රී සංඝරක්ඛිත විජිතසිරි අනුනායක ස්වමීන්වහන්සේ  සාහිත්‍ය චක්‍රවර්ති,





**උපකුලපති**

මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න
(2021.10.01 සිට)

**පීඨාධිපතිවරු**

පීඨාධිපති, දේශීය වෛද්‍ය විද්‍යා පීඨය

ආචාර්ය ඩබ්ලිව්. ජේ. වික්‍රමාරච්චි මහත්මිය
(2021.12.23 සිට)



පීඨාධිපති, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය

ආචාර්ය එන්.ටී.බී. මධුශංක
(2021.09.29 සිට)



පීඨාධිපති, දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය

ආචාර්ය ජී.කේ.ජයතිලක
(2021.10.01 සිට)



පීඨාධිපති, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

ආචාර්ය ඩබ්ලිව්.ඒ.එල්.සී.වැලිවිට



ලේඛකාධිකාරී

බී.ඒ.එන්.ක්‍රිශාන්ත මහතා



වැඩබලන පුස්තකාලයාධිපති

ආචාර්ය නයනා විජයසුන්දර මහත්මිය
(2021.07.15 සිට)



මුල්‍යාධිකාරී

සී.ජී.කොතලාවල මහතා



## 7. පීඨ සහ අධ්‍යයන අංශ

**දේශීය වෛද්‍ය විද්‍යා පීඨය**

- ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය
- චිකිත්සා අධ්‍යයන අංශය
- ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය
- කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය
- ශල්‍යශාලක්‍ය අධ්‍යයන අංශය
- භාෂා අධ්‍යයන අංශය
- රෝග විඥාන අධ්‍යයන අංශය
- දේශීය චිකිත්සා අධ්‍යයන අංශය

**දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය**

- දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය
- දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය
- තාක්ෂණ අධ්‍යයන අංශය

**දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය**

- දේශීය සාමාජීය විද්‍යා අධ්‍යයන අංශය
- කළමනාකරණ අධ්‍යයන අංශය

**පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය**

## 8. පීඨ පිරිනමන ප්‍රථම උපාධි වැඩසටහන්

| පීඨය | උපාධි වැඩසටහන |
|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (BAMS) |
| දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය | යෝග සහ පරාමනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය |
| | සෞඛ්‍ය සංචාරක කර්මාන්තය සහ සත්කාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය |
| | දේශීය වෛද්‍ය සම්පත් පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය |
| | දේශීය ඖෂධ තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය |
| | ජෛවවෛද්‍ය තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය |
| | සෞඛ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය |
| දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය | දේශීය දැනුම පිළිබඳ සාමාජීය අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය |

## 9. විශ්වවිද්‍යාලය පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන්

| පීඨය | පශ්චාත් උපාධිය/ඩිප්ලෝමාව |
|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | ආයුර්වේද ආයතන කළමනාකරණ සහ පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය |
| | කායචිකිත්සාව පිළිබඳ විද්‍යාපති උපාධිය |
| | පංචකර්මය පිළිබඳ විද්‍යාපති උපාධිය |
| | ශල්‍යතන්ත්‍රය පිළිබඳ විද්‍යාපති උපාධිය |
| | ආයුර්වේද ආයතන කළමනාකරණ සහ පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | කායචිකිත්සාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | පංචකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | ශල්‍යතන්ත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | යෝග විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |

## 10. විශ්වවිද්‍යාලය පිරිනමන බාහිර පාඨමාලා

| පීඨය/ඒකකය/මධ්‍යස්ථානය | පාඨමාලාව |
|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | යෝග සහ සංයම අභ්‍යාස පිළිබඳ ඩිප්ලෝමාව |
| | ආයුර්වේද ඖෂධවේදී පිළිබඳ ඩිප්ලෝමාව |
| | යෝග සහ සංයම අභ්‍යාස පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව |
| | ජ්‍යෝතිශ්‍ය ශාස්ත්‍රය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව |

## 11. ආරම්භ කළ නව පාඨමාලා පිළිබඳ විස්තර – 2021

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | සහතිකපත්‍ර /ඩිප්ලෝමාව | උපාධිය | පශ්වාත් උපාධි ඩිප්ලෝමාව | ශාස්ත්‍රපති | විද්‍යාපති | ආචාර්ය උපාධිය |
|---|---|---|---|---|---|---|---|---|
| දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය | යෝග සහ පරාමනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී | ඉංග්‍රීසි | | ✓ | | | | |
| | සෞඛ්‍ය සංචාරක කර්මාන්තය සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී | ඉංග්‍රීසි | | ✓ | | | | |
| | දේශීය වෛද්‍ය සම්පත් පිළිබඳ විද්‍යාවේදී | ඉංග්‍රීසි | | ✓ | | | | |
| | දේශීය ඖෂධ තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී | ඉංග්‍රීසි | | ✓ | | | | |
| | ජෛව වෛද්‍ය තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී | ඉංග්‍රීසි | | ✓ | | | | |
| | සෞඛ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී | ඉංග්‍රීසි | | ✓ | | | | |
| දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය | දේශීය දැනුම පිළිබඳ සාමාජීය අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී | ඉංග්‍රීසි | | ✓ | | | | |

## 12. දේශීය ශිෂ්‍යයින් පිළිබඳ විස්තර – 2021

| පීඨය | උපාධි වැඩසටහන | මාධ්‍යය | 2021 බඳවා ගැනීම | 1වැනි වසරේ ශිෂ්‍යයින් (2019/ 2020) | 2වැනි වසරේ ශිෂ්‍යයින් | | 3වැනි වසරේ ශිෂ්‍යයින් (2016/ 2017) | 4වැනි වසරේ ශිෂ්‍යයින් (2015/ 2016) | 5වැනි වසරේ ශිෂ්‍යයින් (2014/ 2015) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | (2018/ 2019) | (2017/ 2018) | | | |
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය | සිංහල | 120 | 115 | 102 | 88 | 103 | 68 | 66 |

## 13. 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍යයින්ගේ විස්තර

| පීඨය | අධ්‍යයන වැඩසටහන | එකඟ වූ බඳවා ගැනීම | ලියාපදිංචි කළ සංඛ්‍යාව |
|---|---|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය | 120 | 115 |

## 14. උපාධිධාරී නිමැවුම – 2021

| පීඨය | උපාධි වැඩසටහන | උපාධිධාරී ශිෂ්‍යයින් සංඛ්‍යාව |
|---|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය | 61 |

## 15. පශ්චාත් උපාධි නිමැවුම – 2021

| පීඨය | උපාධි වැඩසටහන | පශ්චාත් උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | පංචකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 01 |

## 16. මානව සම්පත් සහ ශිෂ්‍යයින් පිළිබඳ විස්තර – 2021

| පීඨය | උපාධි වැඩසටහන | මුළු ශිෂ්‍යයින් | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු පරිපාලන කාර්ය මණ්ඩලය | මුළු අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය | 542 | 36 | 1 | 2 | 26 |
| දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය | ප්‍රථම උපාධි වැඩසටහන් හයක් | - | 25 | 1 | - | 7 |
| දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය | දේශීය දැනුම පිළිබඳ සාමාජීය අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | - | 9 | 1 | 1 | 3 |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | | - | - | 1 | - | 3 |
| **එකතුව** | | **542** | **70** | **04** | **03** | **39** |

# 17. ශිෂ්‍ය කටයුතු

## 17.1 ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් – 2021

## 17.2 ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව - 2021





## 17.1. ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් – 2021

| නේවාසිකාගාරයේ නම | හිමිකාරත්වය | නේවාසිකාගාර පහසුකම් සැලසිය හැකි සංඛ්‍යාව | | පහසුකම් සැලසූ සංඛ්‍යාව (2021 දෙසැම්බර් 31 වැනි දිනට) | |
|---|---|---|---|---|---|
| | | පිරිමි | කාන්තා | පිරිමි | කාන්තා |
| සෙනෙවිරත්න නේවාසිකාගාරය | පෞද්ගලික | 34 | - | 31 | - |
| රන්වැලි නේවාසිකාගාරය | පෞද්ගලික | 20 | - | 19 | - |
| මහවිට නේවාසිකාගාරය | පෞද්ගලික | 18 | - | 17 | - |
| සමගි මාවත නේවාසිකාගාරය | පෞද්ගලික | 36 | - | 17 | - |
| වික්‍රමාරච්චි නේවාසිකාගාරය | විශ්වවිද්‍යාලය | - | 134 | - | 124 |
| පරාක්‍රම නේවාසිකාගාරය | පෞද්ගලික | - | 52 | - | 40 |
| කරුණානායක නේවාසිකාගාරය | පෞද්ගලික | - | 45 | - | 38 |
| **එකතුව** | | **108** | **231** | **84** | **202** |

## 17.2. ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව –2021

| පීඨය | මහපොළ | ශිෂ්‍යාධාර |
|---|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | 75 | 266 |

## 18. මානව සම්පත්

### 18.1 2021.12.31 දිනට සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය, විධායක කාර්ය මණ්ඩලය, පුස්තකාල කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර



## 18.1 2021.12.31 දිනට සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය, විධායක කාර්ය මණ්ඩලය, පුස්තකාල කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| සේවා කාණ්ඩය | වැටුප් කේතය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| **ප්‍රාථමික මට්ටම** | | | | |
| ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු | PL - 1 | 36 | 24 | 10 |
| ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ පුහුණු | PL - 2 | 9 | 4 | 1 |
| ප්‍රාථමික ශ්‍රේණිය - පුහුණු | PL - 3 | 14 | 19 | 1 |
| **ද්විතීය මට්ටම** | | | | |
| කළමනාකරණ සහකාර – ශිල්පීය නොවන | U-MN 1 | 70 | 43 | 1 |
| කළමනාකරණ සහකාර - ශිල්පීය* | U-MN 1 | 20 | 15 | 3 |
| ආශ්‍රිත නිලධාරීන් - 2වැනි කාණ්ඩය | U-MN 2 | 2 | 2 | 0 |
| ආශ්‍රිත නිලධාරීන් - 1වැනි කාණ්ඩය | U-MN 3 | 2 | 2 | 0 |
| කාර්ය මණ්ඩලය සහායක/අධිපන්ති සහා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සහායක | U-MN 4 | | 26 | |
| **තෘතීය මට්ටම** | | | | |
| ශාස්ත්‍රීය සහායක - 2වැනි කාණ්ඩය | U-AS 1 | 1 | 1 | 0 |
| කණිෂ්ඨ විධායක / කළමනාකරුවන්* | U-EX 1 | 11 | 9 | 3 |
| ශාස්ත්‍රීය සහායක - 1වැනි කාණ්ඩය | U-AS 2 | 5 | 5 | 0 |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | |
| වෛද්‍ය නිලධාරී | U-MO 1 | 2 | 0 | 2 |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී | U-MO 2 | | | |
| මැදි පෙළ විධායක* | U-EX 2 | 6 | 6 | 1 |
| මැදි පෙළ විධායක නිලධාරීන් | U-EX 2(අ) | | | |
| ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් | U-EX 3 | 2 | 2 | 0 |
| කථිකාචාර්ය | U-AC 3 | 77 | 77 | 0 |
| ආශ්‍රිත මහාචාර්යවරු | U-AC 4 | | | |
| මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U-AC 5 | | | |
| **එකතුව** | | **257** | **235** | **22** |

*තාක්ෂණික නිලධාරීන් දෙදෙනෙක් විධායක ශ්‍රේණියේ සිටී. ඔවුන් දැනට තිබෙන සේවක සංඛ්‍යාවේ U-EX 1 සහ U-EX 2 කාණ්ඩවල ඇතුළත් කර සිටින නමුත් ඔවුන්ගේ සැබෑ සේවක සංඛ්‍යාව U-MN1 හි ඇතුළත් කර ඇත.

# 19. පර්යේෂණ සහ සංවර්ධනය

## 19.1 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

## 19.2 ලැබූ සම්මාන පිළිබඳ විස්තර





## 19.1. පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

**දේශීය වෛද්‍ය විද්‍යා පීඨය**

| | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | දේශීයව ප්‍රකාශ කළ | විදේශීයව ප්‍රකාශ කළ |
| 1 | විද්‍යුත්-වාරසහරා ඇතුළු යොමු කළ සූචිගත වාරසහරාවල ප්‍රකාශන සංඛ්‍යාව | | - | 22 |
| 2 | විද්‍යුත්-වාරසහරා ඇතුළු යොමු කළ සූචිගත නොකළ වාරසහරාවල ප්‍රකාශන සංඛ්‍යාව | | - | 12 |
| 3 | සම්මන්ත්‍රණ කාර්යසටහන් | 3.1 සම්පූර්ණ ලිපි ලෙස ප්‍රකාශ කළ ලිපි සංඛ්‍යාව | 02 | 04 |
| | | 3.2 උද්ධෘත ප්‍රකාශන සංඛ්‍යාව | 03 | 18 |
| 4 | ග්‍රන්ථ පරිච්ඡේද ප්‍රකාශන සංඛ්‍යාව | | - | - |
| 5 | විශේෂඥ ක්ෂේත්‍රය තුළ ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථ/ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව | 5.1 ප්‍රකාශකයෙක් මඟින් | - | 01 |
| | | 5.2 කර්තෘ මඟින් | - | 03 |

**දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය**

| | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | දේශීයව ප්‍රකාශ කළ | විදේශීයව ප්‍රකාශ කළ |
| 1 | විද්‍යුත්-වාරසහරා ඇතුළු යොමු කළ සූචිගත වාරසහරාවල ප්‍රකාශන සංඛ්‍යාව | | 01 | 03 |
| 2 | විද්‍යුත්-වාරසහරා ඇතුළු යොමු කළ සූචිගත නොකළ වාරසහරාවල ප්‍රකාශන සංඛ්‍යාව | | - | - |
| 3 | සම්මන්ත්‍රණ කාර්යසටහන් | 3.1 සම්පූර්ණ ලිපි ලෙස ප්‍රකාශ කළ ලිපි සංඛ්‍යාව | 04 | - |
| | | 3.2 උද්ධෘත ප්‍රකාශන සංඛ්‍යාව | 27 | - |
| 4 | ග්‍රන්ථ පරිච්ඡේද ප්‍රකාශන සංඛ්‍යාව | | 01 | - |
| 5 | විශේෂඥ ක්ෂේත්‍රය තුළ ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථ/ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව | 5.1 ප්‍රකාශකයෙක් මඟින් | - | - |
| | | 5.2 කර්තෘ මඟින් | - | - |

**දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය**

| | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | දේශීයව ප්‍රකාශ කළ | විදේශීයව ප්‍රකාශ කළ |
| 1 | විද්‍යුත්-වාරසහරා ඇතුළු යොමු කළ සූචිගත වාරසහරාවල ප්‍රකාශන සංඛ්‍යාව | | 02 | 07 |
| 2 | විද්‍යුත්-වාරසහරා ඇතුළු යොමු කළ සූචිගත නොකළ වාරසහරාවල ප්‍රකාශන සංඛ්‍යාව | | - | - |
| 3 | සම්මන්ත්‍රණ කාර්යසටහන් | 3.1 සම්පූර්ණ ලිපි ලෙස ප්‍රකාශ කළ ලිපි සංඛ්‍යාව | 08 | - |
| | | 3.2 උද්ධෘත ප්‍රකාශන සංඛ්‍යාව | 01 | - |
| 4 | ග්‍රන්ථ පරිච්ඡේද ප්‍රකාශන සංඛ්‍යාව | | - | - |
| 5 | විශේෂඥ ක්ෂේත්‍රය තුළ ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථ/ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව | 5.1 ප්‍රකාශකයෙක් මඟින් | - | - |
| | | 5.2 කර්තෘ මඟින් | - | - |

## 19.2. ලැබූ සම්මාන පිළිබඳ විස්තර

| පීඨය | සම්මානලාභීන්ගේ නම් | සම්මාන කාණ්ඩය | සම්මානයේ නම | ජාතික/ අන්තර්ජාතික | සම්මානය පිළිබඳ විස්තරය | සම්මානලාභීගේ සහ රටේ නම |
|---|---|---|---|---|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | වෛද්‍ය කේ.ජී.සී.දිසානායක | උපකුලපතිගේ සම්මාන 2020 2021.01.01 වැනි දින සම්මානය පිරිනමන ලදී. | සුවිගත වාරසහරාවල වැඩිම ප්‍රකාශන සංඛ්‍යාවක් ඇති පර්යේෂක - 2020 GWAI/UOK | ජාතික/ විශ්වවිද්‍යාල මට්ටම | පර්යේසණ සම්මාන | කැළණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව |
| | වෛද්‍ය කේ.ජී.සී.දිසානායක | උපකුලපතිගේ සම්මාන 2020 2021.01.01 වැනි දින සම්මානය පිරිනමන ලදී. | කැපීපෙනෙන ජොෂ්ය පර්යේෂක - 2020 GWAI/UOK | ජාතික/ විශ්වවිද්‍යාල මට්ටම | පර්යේසණ සම්මාන | කැළණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව |
| | මහාචාර්ය කේ.පී.පී. පීරිස් | උපකුලපතිගේ සම්මාන 2020 2021.01.01 වැනි දින සම්මානය පිරිනමන ලදී. | කැපීපෙනෙන ජොෂ්ය පර්යේෂක – 2020 – 1වැනි ස්ථානය - GWAI- UOK | ජාතික/ විශ්වවිද්‍යාල මට්ටම | පර්යේසණ සම්මාන | කැළණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව |
| | වෛද්‍ය පී.ඒ.ඩී.එච්.ජේ. ගුණතිලක | SSI | කැළණිය විශ්වවිද්‍යාලයේ සෙනෙට් සභාවේ සම්මානය | ජාතික/ විශ්වවිද්‍යාල මට්ටම | පර්යේසණ සම්මාන | කැළණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව |

# 20. වෙනත් ඒකක සහ මධ්‍යස්ථාන

**20.1** පුස්තකාලය

**20.2** ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය

**20.3** වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය

**20.4** කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

**20.5** වෛද්‍ය මධ්‍යස්ථානය

**20.6** තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය

**20.7** මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය

**20.8** ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය (CGEE)

**20.9** සමාජ සංහිඳියා මධ්‍යස්ථානය (SRC)

**20.10** තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය







## 20.1. පුස්තකාලය



**පසුබිම් තොරතුරු**

විශ්වවිද්‍යාලයේ ආයුර්වේදය, දේශීය වෛද්‍ය ක්‍රමය, වෛද්‍ය විද්‍යා, සෞඛ්‍ය විද්‍යාව සහ වෙනත් ආශ්‍රිත විෂයන් පිළිබඳ ශික්ෂණය, ඉගෙනුම සහ පර්යේෂණ යන ප්‍රධාන කුළුණු ත්‍රිත්වය සඳහා අවශ්‍ය සම්පත් සම්පාදනය මෙම පුස්තකාලයේ ප්‍රධාන පරමාර්ථයන් වේ. පුස්තකාලය මඟින් විශිෂ්ට සහ නවෝත්පාදන පුස්තකාල සේවාවන් සහ නිපැයුම් සම්පාදනය සහ ප්‍රවර්ධනය හරහා මෙම පරමාර්ථ අත්කර ගනු ඇත. මෙයට අමතරව, දුරස්ථ ප්‍රවේශය ඇතිව ඉලෙක්ට්‍රොනික සම්පත් වැඩිවශයෙන් ප්‍රදානය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර පුස්තකාල කාර්යයන් ස්වයංක්‍රීයකරණය මඟින් සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවගේ ප්‍රතිලාභය සඳහා වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී පුස්තකාල සේවා සපයනු ඇත.

ඉහත සඳහන් කළ පරමාර්ථ සාක්ෂාත් කර ගනු පිණිස, පුස්තකාලය එහි ග්‍රන්ථ එකතුව, පොත් බැහැරදීමේ අංශය, උපලේඛණගත යොමු අංශය, ස්ථිර යොමු අංශය සහ දුර්ලභ ග්‍රන්ථ එකතුව ලෙස සංවිධානගත කර ඇත. පුස්තකාල එකතුවට සිංහල, ඉංග්‍රීසි, සංස්කෘත, පාලි, හින්දි සහ බෙංගාලි භාෂාවලින් ප්‍රකාශයට පත් කළ 34,000කට අධික ශාස්ත්‍රීය නිබන්ධන අන්තර්ගත වේ. මෙම එකතුවට පැල් කොළ මත ලියන ලද අත්පිටපත් කිහිපයක් ද ඇතුළත් වේ. පුස්තකාලයේ ඇති සියලුම ග්‍රන්ථ සම්මත වර්ගීකරණ ක්‍රමයක් වන ඩේවි දශම වර්ගීකරණ ක්‍රමය (Dewey Decimal Classification System) අනුව වර්ගීකරණය කර සකසා ඇති අතර ඇන්ග්ලෝ-ඇමෙරිකානු නාමාවලි රීති (Anglo-American Cataloguing Rules - AACR-2 R) අනුකූලව වර්ගීකරණය කර ඇත. මෙම එකතුව කොහා ඒකාබද්ධ පුස්තකාල කළමනාකරණ ක්‍රමය (Koha integrated library management system) භාවිතා කරමින් පරිගණකගත කරමින ඇත. Koha යනු විවෘත-මූලාශ්‍ර මෘදුකාංග පද්ධතියකි.

**ගොඩනැගිල්ල**

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය මහල් හතරකින් සැදුම්ලත්, පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි අනුස්මරණ පුස්තකාල ගොඩනැගිල්ලේ පිහිටුවා ඇත. එය උසස් අධ්‍යාපන අවශ්‍යතාවන් සපුරාලීම පිණිස එම මට්ටමට සංවර්ධනය කරමින් ඇත.

**සහභාගී වූ වැඩමුළු**

- එක්සෙල් භාවිතා කිරීම 2021.12.17 වැනි දින – සියලුම පුස්තකාල කාර්ය මණ්ඩලයට
- කාර්යාල කාර්යපටිපාටි - පුස්තකාල තොරතුරු සහකාර සහ තාක්ෂණික නිලධාරීන් සඳහා 2021.12.22 වැනි දින
- කාර්යාල කාර්යපටිපාටි - පුස්තකාල සහායක නිලධාරීන් සඳහා 2021.12.21 වැනි දින

**ලියාපදිංචි පරිශීලකයින්**

| පර්ශීලකයින් | | 2020.12.31 දක්වා | 2021 දී |
|---|---|---|---|
| ශිෂ්‍යයින් | | 422 | 95 |
| අධ්‍යයන කාර්යමණ්ඩලය | ස්ථිර | 37 | 16 |
| | තාවකාලික | 79 | - |
| විධායක කාර්ය මණ්ඩලය | | 03 | 01 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 81 | 08 |

**ග්‍රන්ථ සහ වාරසඟරා වැය ශීර්ෂය**

**ග්‍රන්ථ සහ වාරසඟරා -** රු. 1,250,000

**වියදම**

| | |
|---|---|
| ග්‍රන්ථ | රු. 3280.00 (ග්‍රන්ථ දෙකක්) |
| වාරසඟරා | - |
| මුළු වියදම | රු. 3280.00 |

**ග්‍රන්ථ තොගය**

2021.12.31 වැනි දිනට ඇති ග්‍රන්ථ තොගයේ සංඛ්‍යාව - 34,153

## 20.2. ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය



**හැඳින්වීම**

ශාරීරික අධ්‍යාපන ඒකකය ශිෂ්‍යයින් සඳහා සෞඛ්‍යසම්පන්න ක්‍රියාකාරී ජීවන රටාවක් දිරිමත් කරන, තුලනාත්මක ක්‍රීඩා ජීවිතයක් පිරිනැමීමට වගකීම දරයි.

**දැක්ම**

ශක්තිමත් ක්‍රීඩා සහභාගීත්ව සංස්කෘතියක් සහ උද්යෝගීමත් ක්‍රීඩා ජීවිතයක් ගොඩනැගීම.

**මෙහෙවර**

දක්ෂ ශිෂ්‍ය මළල ක්‍රීඩකයින්ගේ ශාස්ත්‍රීය සහ ක්‍රීඩා කාර්යසාධනය යන අංශ දෙකේම විශිෂ්ටත්වය පෝෂණය කිරීම සහ සියලුම ශිෂ්‍යයින් අතර ක්‍රියාකාරී ජීවන රටාවක් සහතික කිරීම.

**ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශයේ කණ්ඩායම් ව්‍යුහය**

මෙම අවස්ථාවේ දී සේවයේ නිරත වන්නේ එක් උපදේශකයෙක් පමණි, ශාරීරික අධ්‍යාපන අංශයේ අධ්‍යක්ෂවරයෙක් නොමැති අතර ක්‍රීඩා සම්බන්ධීකාරකවරයෙක් සේවය කරනු ලබයි. ව්‍යායාම් ශාලා සහායකයෙක් සේවය කරනු ලබන අතර ඔහු සුළු කාර්ය මණ්ඩලයට අයත් වේ.

**වාර්ෂික වැඩසටහන්**

විශ්වවිද්‍යා ක්‍රීඩා පිළිබඳ අන්තර්ජාතික දිනය (දිනය: 2021 සැප්තැම්බර් මස 19 සහ 20) මෙම මාර්ගගත අවස්ථාව සියලුම විශ්වවිද්‍යාල ක්‍රීඩා ශිෂ්‍යයින්ගේ සහභාගීත්වයෙන් සූම් තාක්ෂණය යොදා ගෙන පවත්වන ලදී.

**වෙනත් තරඟාවලි**

- අන්තර්-විශ්වවිද්‍යාල මාර්ගගත චෙස් තරඟාවලිය – 2021
- 1 වැනි අතථ්‍ය අන්තර්-විශ්වවිද්‍යාල ටයික්වොන්ඩෝ පූම්සායි තරඟාවලිය – 2021
- 1 වැනි අතථ්‍ය අන්තර්-විශ්වවිද්‍යාල කරාතේ තරඟාවලිය – 2021

**විශේෂ වැඩසටහන්**

නවක ශිෂ්‍ය කණ්ඩායම සඳහා මාර්ගගත ක්‍රීඩා හඳුන්වාදීම (දිනය:2021 ජුනි මස 14 වැනි දින)

**දිශානුගත වැඩසටහන**

ශාරීරික අධ්‍යාපන ඒකකයට වෙන් කළ වේලාවක් නොමැති නමුත් අපි නවක ශිෂ්‍ය කණ්ඩායමට ක්‍රීඩා හඳුන්වාදීමේ මාර්ගගත වැඩසටහනක් සංවිධානය කළෙමු (2021 ජුනි මස 14වැනි දින)

**කලාපීය ක්‍රීඩා සංවර්ධනය සඳහා දායකත්වය**

| **ගෘහස්ථ ක්‍රීඩාංගනය වෙන් කිරීම** | | | |
|---|---|---|---|
| **දිනය** | **ආයතනය හෝ සමාගම** | **අවස්ථාව** | **සම්පූර්ණ දිනය හෝ දින භාගයක්** |
| 2021.11.17 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | SSM 282 1.0 බැඩ්මින්ටන් පාඨමාලා ඒකකයේ ප්‍රායෝගික පරීක්ෂණය පවත්වන ලදී. | සම්පූර්ණ දිනය |



## 20.3. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය (CGU) විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ වෘත්තීය සහ මෘදු කුසලතාවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ ප්‍රථම උපාධි අපේක්ෂකයින් සහ කර්මාන්ත අංශය අතර සබැඳිය ශක්තිමත් කිරීමේ පරමාර්ථ ඇතිව ස්ථාපිත කර ඇත. සිය වෘත්තීය ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් ධනාත්මකව දායකවිය හැකි සවිබල ගැන්වූ දක්ෂ නිපුණතාවලින් යුත් රැකියාගත කළ හැකි උපාධිධාරීන් බිහි කිරීම පිණිස ඒකකය විශ්වවිද්‍යාලයට සහාය වෙයි.

උපාධි අපේක්ෂක විද්‍යාර්තයින්ට වර්තමාන ගෝලීයකරණයේ අවශ්‍යතාවන්ට අනුව කටයුතු කළ හැකි සහ ජීවිත කාලය පුරාවට ඉගෙනුම් හැකියාවන් සංවර්ධනය කර ගැනීමට උපාධි අපේක්ෂකයින්ගේ හැකියාවන් සහ නිපුණතා දියුණු කිරීම පිණිස ඒකකය මඟින් විද්‍යාර්ථයින් සඳහා වැඩමුළු, සම්මන්ත්‍රණ, සායක සහ ව්‍යවසායකත්ව වැඩසටහන් ආදිය සංවිධානය කරනු ලබයි. එමෙන්ම ඒකකය මඟින් සන්නිවේදන කුසලතා, අන්තර්-පුද්ගල කුසලතා, ඉදිරිපත් කිරීමේ කුසලතා, කාලය කළමනාකරණය, කණ්ඩායම් වැඩ, සංවිධානාත්මක කුසලතා සහ අධ්‍යයන ආධාර කුසලතා වැනි මෘදු කුසලතා සංවර්ධනය කිරීම සඳහා ද ප්‍රමුඛතාවක් ලබා දෙයි.

මෙයට අමතරව, සංචාරක හෝටල් සහ වෙනත් සෞඛ්‍ය හා කළමනාකරණ විෂයන් ඇතුළු පෞද්ගලික අංශයේ වෘත්තීය අවස්ථාවන් සඳහා උනන්දුවක් දක්වන විද්‍යාර්ථයින්ට එම අවස්ථාවන් පිළිබඳව දැනුවත් කිරීම මඟින් එම රැකියාගත කිරීම් සඳහා අවශ්‍ය මඟපෙන්වීම ලබාදීමෙන් ද ඒකකය ඔවුන් සඳහා ප්‍රතිලාභ සපයනු ලබයි.

**කාර්ය මණ්ඩල තනතුරු**

1. සම්බන්ධීකාරක - වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය

## 20.4. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

**හැඳින්වීම**

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) සියලුම විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සංවර්ධනය පිණිස විශ්වවිද්‍යාලයේ පිහිටුවා ඇති සේවා මධ්‍යස්ථානය වන අතර ආයතනික සංවර්ධන ව්‍යාපෘති සහ මූලාරම්භයන් ගණනාවක් සඳහා වගකීම දරයි.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ මානව සම්පත් උපාය මාර්ගය සකස් කිරීම, සෑම සේවකයෙකුගේම ගමන් මඟේ වැදගත් සන්දිස්ථානවල දී ඉහළ කාර්යක්ෂමතාවක් සහ ශක්තිමත් සහයෝගීතා නිර්මාණය කිරීම සහ තනි පුද්ගලයින්ට සහ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයට ඉහළ කාර්යාක්ෂමතා මට්ටම් අත්කර ගත හැකි තත්ත්වයන් නිර්මාණය කිරීම පිණිස මානව සම්පත් සමඟ උපාය මාර්ගික සහකරු ලෙස කටයුතු කරයි.

ඉගෙනුම සහ ශික්ෂණය ඉහළ ගෞරවයෙන් සලකනු ලබන අතරම සහභාගීත්ව සහ ඉගෙනුම් කේන්ද්‍රීය අධ්‍යාපනයට අනුග්‍රහය දක්වන ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ නව සංස්කෘතියට දායකවීම.

ඉගෙනුම වැඩිදියුණු කිරීම පිණිස තාක්ෂණයේ විචාරාත්මක සහ ඵලදායී යොදා ගැනීම භාවිතා කරමින් විෂය සීමාවන් ඇතුළත සහ ඉන් පිටතට ගවේෂණය සහ පරාවර්තනය දිරිමත් කිරීම.

**දැක්ම/මෙහෙවර**

ශාස්ත්‍රීය වෘත්තිය සහ පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කිරීමට අවශ්‍ය කරන පෞද්ගලික සහ වෘත්තීය සංවර්ධන අවස්ථාවන්ට පහසුකම් සලසමින් විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.

**පරමාර්ථ**

1. විශ්වවිද්‍යාලයේ සියලුම කාර්යයන් සම්බන්ධයෙන් පර්යේෂණ-තොරතුරුලත් ප්‍රවේශයක් යොදා ගැනීම මඟින් සහ ශිෂ්‍යයින්ගේ ඉගෙනුම් වැඩිදියුණු කිරීම පිණිස විශ්වවිද්‍යාලය පුරාවට පර්යේෂණ පාදක ව්‍යවහාර දිරිමත් කිරීම මඟින් විශ්වවිද්‍යාලයේ ප්‍රමිතීන් ඉහළ නංවා ගැනීම
2. සහභාගීත්ව සහ ඉගෙනුම් කේන්ද්‍රීය අධ්‍යාපනයක් සඳහා ආධාර දෙන අතර ඉගෙනුම සහ ශික්ෂණය සඳහා ඉහළ ස්ථානයක් හිමිකරවන විශ්වවිද්‍යාලය තුළ නව සංස්කෘතියක් සඳහා දායකවීම.
3. ඉගෙනුම වැඩිදියුණු කිරීම පිණිස තාක්ෂණයේ විචාරාත්මක සහ ඵලදායී යොදා ගැනීම භාවිතා කරමින් විෂය සීමාවන් ඇතුළත සහ ඉන් පිටතට ගවේෂණය සහ පරාවර්තනය දිරිමත් කිරීම.
4. විවිධ වැඩ මාලා සහ මූලාරම්භයන්ට මඟපාදන හෝ දායක වන විශ්වවිද්‍යාල මානව සම්පත් උපාය මාර්ග ක්‍රියාත්මක කරවීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කිරීම.
5. විශ්වවිද්‍යාලය තුළ සහ පිටත සියලුම වෘත්තිකයින් සඳහා, විවිධ ප්‍රවේශ සහ මැදිහත්වීම් භාවිතා කරමින්, විස්තීරණ සහ ඉහළ ගුණාත්මකභාවයකින් යුත් වෘත්තීය පාඨමාලා සහ පුහුණු වැඩසටහන් ලබාදීම.
6. ආයතනික නිර්මාණ සැලසුම්, වෙනස්කම් පිළිබඳ ක්‍රමවේද සහ යෝග්‍ය මැදිහත්වීම් හරහා ආයතනයේ උපාය මාර්ගික සහ මෙහෙයුම් මට්ටම්වල වෙනස්කම් සඳහා අනුග්‍රහය දැක්වීම.
7. නායකත්වය, කුසලතා කළමනාකරණය, යහපැවැත්ම, නියැලීම සහ කාර්යසාධනය වැනි විවිධ තේමාවන් හරහා ආයතනික සංවර්ධනය සඳහා උපායමාර්ග ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීම

**කාර්ය මණ්ඩල තනතුරු**

1. සම්බන්ධීකාරක - කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 2021 වර්ෂයේ දී පවත්වන ලද විශේෂ වැඩසටහන්

| වැඩසටහනේ නම | කා සඳහා ද |
|---|---|
| ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල පද්ධතිය පිළිබඳ හැඳින්වීම | CCSD 1වැනි ශිෂ්‍ය කණ්ඩායම |
| කණ්ඩායම් ගොඩනැගීම සහ කණ්ඩායම් වැඩ | CCSD 1වැනි ශිෂ්‍ය කණ්ඩායම |
| ඵලදායී ගුරුවරයෙක් වීම | CCSD 1වැනි ශිෂ්‍ය කණ්ඩායම |
| ඵලදායී පර්යේෂකයෙක් වීම | සියලුම කාර්ය මණ්ඩලය |
| උසස් අධ්‍යාපනය තුළ තොරතුරු සන්නිවේදන තාක්ෂණය | CCSD 1වැනි ශිෂ්‍ය කණ්ඩායම |
| පුද්ගලික/ ජීවිත කුසලතා වැඩිදියුණු කිරීම | CCSD 1වැනි ශිෂ්‍ය කණ්ඩායම |

## 20.5. වෛද්‍ය මධ්‍යස්ථානය

**හැඳින්වීම**

වෛද්‍ය මධ්‍යස්ථානය ශිෂ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ පිහිටුවා ඇති අතර 2020 වර්ෂය තුළ දී විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන කර්තව්‍යයක් ඉටු කරනු ලදී. ශිෂ්‍යයින්ගේ සහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සුළු රෝග තත්ත්වයන්වල දී ප්‍රතිකාර සැලසීම හැරුණු කොට කොවිඩ් වසංගත තත්ත්වය තුළ දී සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට සහ කාර්ය මණ්ඩලයට සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම සම්බන්ධයෙන් වෛද්‍ය මධ්‍යස්ථානය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී.

**ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය සඳහා ලබා දෙන පහසුකම්**

විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ සහ කාර්ය මණ්ඩලයේ සියලුම සෞඛ්‍ය අවශ්‍යතාවන් සලසා දීම සහ සම්බන්ධීකරණය කරනු ලබයි. මෙම මධ්‍යස්ථානය සතියේ දිනවල පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා ක්‍රියාත්මක වෙයි. වෛද්‍ය මධ්‍යස්ථානය මඟින් බාහිර ප්‍රතිකාර අංශයේ වෛද්‍ය උපදේශනය, ප්‍රතිකාර සහ විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා හදිසි අවස්ථා ප්‍රතිකාර ලබා දෙයි.

තව ද, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සිය අධ්‍යයන කටයුතුවල දී නිවාඩු ලබා ගැනීම හෝ නොපැමිණීම සම්බන්ධයෙන් යොමු කරන වෛද්‍ය සහතිකවල නිවැරදිභාවය ද වෛද්‍ය මධ්‍යස්ථානය මඟින් සනාථ කරනු ලබයි.

**කාර්ය මණ්ඩල තනතුරු**

1. ප්‍රධාන වෛද්‍ය නිලධාරී
2. හෙද නිලධාරී

## 20.6. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය




**හැඳින්වීම**

තොරතුරු තාක්ෂණ සන්නිවේදන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පරිගණක පහසුකම් සහ සේවා ලබා දෙන පොදු මධ්‍යස්ථානය වේ. මෙම මධ්‍යස්ථානයට ප්‍රධාන විද්‍යාගාරය ඇතුළත් වන අතර පරිගණක පද්ධති 100ක්, සේවාදායකය සහ වෙනත් උපාංගවලින් සැදුම්ලත් වේ.

LEARN හරහා කුලී පදනම මත ලබා ගත් අන්තර්ජාල පහසුකම් ඇත. විශ්වවිද්‍යාලයේ ඕනෑම ශිෂ්‍යයෙක්ට හෝ කාර්ය මණ්ඩල සාමාජිකයෙක්ට පහසුකම් ලබා ගත හැකිය. මෙම පහසුකම් විශ්වවිද්‍යාලයේ ජාල පද්ධතිය හරහා ද ලබා ගත හැකිය. එමෙන්ම, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය නොමිලේ වයිෆයි පහසුකම් ද ලබා දෙයි.

### පුහුණු /දැනුවත් කිරීමේ වැඩසටහන්

පහත දැක්වෙන වැඩමුළු සඳහා තොරතුරු තාක්ෂණ සන්නිවේදන පහසුකම් ලබා දී ඇත;

- එම්එස් එක්සෙල් මෘදුකාංගය පුස්තකාලයේ කාර්යයන් සඳහා භාවිතා කළ හැක්කේ කෙසේ ද - පණ්ඩිත පී පී වික්‍රමාරච්චි අනුස්මරණ පුස්තකාලයේ කාර්ය මණ්ඩලය සඳහා.
- කුඩා ශ්‍රවණාගාරය විශ්වවිද්‍යාලයේ වැඩමුළු, සම්මන්ත්‍රණ, විශේෂ දේශන, කාර්යයන් සහ විශේෂ රැස්වීම් පැවැත්වීම සඳහා පහසුකම් සලසයි.

### කාර්ය මණ්ඩල තනතුරු

| අනුක්‍රම අංකය | තනතුරේ නම | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පරිගණක උපදේශක | 02 |
| 2 | සහකාර ජාල කළමනාකරු | 01 |
| 3 | තාවකාලික ප්‍රදර්ශක | 01 |
| 4 | කාර්ය මණ්ඩල තාක්ෂණික නිලධාරී | 01 |
| 5 | විද්‍යාගාර සහකාර | 01 |

### අදාළ වෙනත් තොරතුරු

එමඟින් පහත දැක්වෙන සේවා සහ පහසුකම් ද සලසනු ලබයි;

- දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි වැඩසටහනේ උපාධි අපේක්ෂකයින් සඳහා I මට්ටම, III මට්ටම සහ IV මට්ටම සඳහා එක් සම්මාන පාඨමාලාවක් සඳහා තොරතුරු තාක්ෂණ වාර්ෂික දේශන සහ ප්‍රායෝගික පරීක්ෂණ පවත්වන ලදී.
- විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ, අධ්‍යයන අංශ, අංශ සහ කාර්ය මණ්ඩල සඳහා තොරතුරු තාක්ෂණික උපදේශනය සහ සේවා සැපයීම
- විශ්වවිද්‍යාලයේ සියලුම පරිගණක සහ අනෙකුත් උපාංග නඩත්තු කිරීම
- LEARN මඟින් කුලී පදනම මත ලබා ගත් රැහැනක් භාවිතා කරමින් විද්‍යුත් තැපැල සහ අන්තර්ජාල පහසුකකම් නඩත්තු කිරීම
- විශ්වවිද්‍යාලය තුළ ඇති LMS සහ ජාල පද්ධති නඩත්තු කිරීම
- විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය (www.gwu.ac.lk) නඩත්තු කිරීම

## 20.7. මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය




### හැඳින්වීම

මෙම දෙමහල් විද්‍යාගාර ගොඩනැගිල්ල ඉහළ මට්ටමේ විද්‍යාගාර ගෘහ උපකරණ, නවීන විද්‍යාගාර උපකරණ සහ විදුලිය, ජලය සහ වායු අඛණ්ඩ සැපයුමකින් සමන්විත වේ. විද්‍යාගාරය ප්‍රධාන විද්‍යාගාරය සහ පර්යේෂණ විද්‍යාගාරය ලෙස අංශ දෙකකින් ඇතුළත් වේ.

## මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය

### ප්‍රධාන විද්‍යාගාරය

ප්‍රධාන විද්‍යාගාරය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි වැඩසටහනේ ක්ෂුද්‍රජීවවිද්‍යාව, ජෛවරසායන විද්‍යාව,පටක ජීව විද්‍යාව,කායික විද්‍යාව සහ පරිවෘත්තීය සහ පෝෂණය වැනි විෂයමාලාවල ප්‍රායෝගික සැසි පැවැත්වීමට යොදා ගනී. මෙයට අමතරව, කාර්මික සහ රාජ්‍ය අංශ සඳහා ආදායම් උත්පාදන පරීක්ෂණ පහසුකම් ද සපයනු ලබයි.

### පර්යේෂණ විද්‍යාගාරය

පර්යේෂණ විද්‍යාගාරය බිම් මහලේ ස්ථාපනය කර ඇති අතර රසායන විද්‍යාව ආශ්‍රිත ප්‍රායෝගික සැසි සහ පර්යේෂණ සිදු කිරීමට භාවිතා කරනු ලබයි.



නව විද්‍යාගාරය ප්‍රායෝගික සැසිවලට සහභාගී වන උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් 85 දෙනෙක්, සිය පර්යේෂණ ව්‍යාපෘතිවල නියැලි ශිෂ්‍යයින් 20 දෙනෙක් සඳහා සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සපයයි.

**දැක්ම**

මධ්‍යම විද්‍යාගාරය විද්‍යාව පදනම වූ ප්‍රවේශයක් හරහා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ පරිසරයක් සපයයි.

**මෙහෙවර**

මධ්‍යම විද්‍යාගාරය ජෛවරසායන විද්‍යාව, ශාක විද්‍යාව සහ ක්ෂුද්‍රජීව විද්‍යාව යනාදී ක්ෂේත්‍රවල පර්යේෂණ කටයුතු පිළිබඳ අවධානය යොමු කරමින් දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පර්යේෂණ කටයුතු දිරිමත් කරයි.

**පරමාර්ථ**

1. නිපුණතා සහිත දේශීය වෛද්‍ය විද්‍යා උපාධිධාරීන් බිහි කිරීම පිණිස උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් සඳහා ප්‍රායෝගික සැසි පිරිනැමීම.

2. දේශීය වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීමට මහපාදන පර්යේෂණ ක්‍රමවේද හඳුන්වාදීම
3. ජාතිකව සහ අන්තර්ජාතිකව පිළිගත් පර්යේෂණ, විමර්ශන විශ්ලේෂණ සේවා සහ සොයාගැනීම් පැවැත්වීම.

**විද්‍යාගාර කාර්ය මණ්ඩලය**

1. විද්‍යාගාර සම්බන්ධීකාරක

**ප්‍රධාන විද්‍යාගාරයේ කාර්ය මණ්ඩලය**

1. ප්‍රධාන තාක්ෂණික නිලධාරී
2. ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරී
3. විද්‍යාගාර සහකාර

**පර්යේෂණ විද්‍යාගාර කාර්ය මණ්ඩලය**

1. තාක්ෂණික නිලධාරී
2. විද්‍යාගාර සහකාර

**විශේෂ වැඩසටහන්**

- ඖෂධීය ශාකසාර පැල ප්‍රමිතිකරණ ශිල්පීය ක්‍රම පිළිබඳ පුහුණු වැඩමුළුව
- වෛද්‍ය විද්‍යාගාර ශිල්පීය ක්‍රම පිළිබඳ වැඩමුළුව
- දේශීය සහ ආයුර්වේද ප්‍රතිකාර පිළිබඳ ක්ෂුද්‍රජීවී නාශක ඵලදායීතාව, රසායනික විශ්ලේෂණය සහ සායනික කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයන





**වෙනත් තොරතුරු**

කාර්ය මණ්ඩලයේ දැනුම සහ නිපුණතා රටේ සිටින උනන්දුවක් දක්වන කණ්ඩායම්, සංවිධාන උපදේශන සේවා, වැඩමුළු සහ පුහුණු සැසි හරහා මාරු කිරීම සහ උපයෝජනය කරනු ලබයි.

## 20.8. ස්ත්‍රී-පුරුෂ සාමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය (CGEE)

**හැඳින්වීම**

ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ සංවේදී විශ්වවිද්‍යාල සංස්කෘතියක් සහ පරිසරයක් විශ්වවිද්‍යාලය තුළ ස්ථාපිත කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට පහසුකම් සැලසීම පිණිස ස්ථාපනය කර ඇති අතර මෙමඟින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට පමණක් නොව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ද (අධ්‍යයන/පරිපාලන/සහාය) සිය වැඩකටයුතු කිසිදු පීඩනයක් හෝ වෙනස්කොට සැලකීමකින් තොරව ඉදිරියට කර ගෙන යාමට හිතකර පරිසරයක් නිර්මාණය කරනු ඇත.

**දැක්ම/මෙහෙවර**

විශ්වවිද්‍යාලයේ සියලුම සාමාජිකයින්ට හිතකර, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සහතික කළ, සහ ඔවුන්ගේ විශිෂ්ට ව්‍යවහාරය අනුව පිළිගැනීමට ලක් වන වැඩ පරිසරයක් සහ ඉගෙනුම් පරිසරයක් ඇති බවට සහතික කිරීම විශ්වවිද්‍යාලයට ආයතනික ධාරිතාව ඇති බවට සහතික කිරීම අපගේ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානයේ දැක්ම වේ.

**පරමාර්ථ**

- ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව, විවිධත්වය සහ නවක වධය පිළිබඳව ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය සඳහා 'විවිධත්වය සමඟ ජීවත්වීම' සහ වෙනත් ආශ්‍රිත පාඨමාලා ආරම්භ කිරීම සහ ඒ වෙනුවෙන් කටයුතු කිරීම
- නවක වධය පිළිබඳ පැමිණිලි පෝටලය පවත්වා ගෙන යාම

**කාර්ය මණ්ඩල තනතුරු**

1. සම්බන්ධීකාරක - ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය (CGEE)

**ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය 2021 වර්සයේ දී පවත්වන ලද විශේෂ වැඩසටහන්**

1. විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය 2021 වර්ෂයේ අග භාගයේ දී ස්ථාපිත කිරීම
2. විවිධත්වය සමඟ ජීවත්වීම පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ලැබුනු අතර 2022 වර්ෂයේ දී ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී

## 20.9. සමාජ සංහිදියා මධ්‍යස්ථානය (SRC)

### හැඳින්වීම

සමාජ සංහිදියා මධ්‍යස්ථානය (SRC) ප්‍රාදේශීය අනන්‍යතා වෙනුවට ශ්‍රී ලාංකික හැඟීම දිරිමත් කරන අතර වෙනස් ආගම් සහ ජනවාර්ගික අතර අවබෝධය ප්‍රවර්ධනය කිරීම පිණිස ස්ථාපිත කර ඇත.

### දැක්ම/මෙහෙවර

සාමාජීය සහ සංස්කෘතික අංශ හරහා සමාජ සංහිදියාව ප්‍රවර්ධනය කිරීම සහ පර්යේෂණ නිමැවුම බෙදා හැරීම.

### පරමාර්ථ

- සංහිදියා සහ සාමය ගොඩනැගීමේ ක්‍රියාවලිවල නිරතවීම සඳහා ශිෂ්‍යයින්ට සහ කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම
- සංහිදියාව අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස ප්‍රවර්ධනය කිරීම
- දිවයිනේ පුළුල් සහ පශ්චාත්-ගැටුම් ගතිකත්වය පිළිබඳ දැනම සහ පර්යේෂණ සඳහා දායකත්වය දැක්වීම
- බාහිර සහ අභ්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ හවුල්කාරත්වය සහ අන්තර්ක්‍රියාකාරීත්වය සඳහා මාර්ගගත/නොබැඳි වේදිකාවන් ගොඩනැගීම
- ද්වේෂය, අවිචාරක මතය, සැකය සහ අවිශ්වාසය යනා දී අංග මුලිනුපුටා දැමීම පිණිස පුද්ගලයින්ට දැනුම ලබා දීම සහ ප්‍රවර්ධනය කිරීම
- කාර්ය මණ්ඩලයේ විවිධ කාණ්ඩ අතර සුහද සබඳතා දිරිමත් කිරීම

### කාර්ය මණ්ඩල තනතුරු

1. අධ්‍යක්ෂ - සමාජ සංහිදියි මධ්‍යස්ථානය (SRC)

### සමාජ සංහිදියා මධ්‍යස්ථානය වර්ෂය 2021 දී පැවැත් වූ විශේෂ වැඩසටහන්

මධ්‍යස්ථානය 2022 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී

## 20.10. තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය

### හැඳින්වීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2015 මැයි මස 05 වැනි දින නිකුත් කළ අංක 04/2015 දරන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුකූලව ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ (GWUIM), තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA). ශ්‍රී ලංකාවේ 16 වැනි විශ්වවිද්‍යාලය සහ පළමු දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ලෙස ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයට ජාතියේ සංවර්ධනය පිණිස නිපුණතාවලින් සමන්විත උපාධිධාරීන් බිහි කිරීම උදෙසා එහි ගුණාත්මකභාවය සහ ප්‍රමිති පවත්වා ගැනීමට වගකීම ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කවුන්සිලයේ (QAC) මඟපෙන්වීම යටතේ ශ්‍රී ලංකා ජාතික තත්ත්ව සහතික රාමුවට අනුකූලව විශ්වවිද්‍යාලය මඟින් පිරිනමන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ශක්තිමත් කිරීමට සහ වැඩිදියුණු කිරීම

තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ වගකීම වේ. විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික මධ්‍යස්ථානය අර්ධ කාලීන පදනම මත සේවය කරන අධ්‍යක්ෂවරයෙක්ගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ. එමෙන්ම අදාළ අධ්‍යයන වැඩසටහන්වලට අදාළ තත්ත්ව සහතික ක්‍රියාකාරකම් සඳහා මඟපෙන්වීම සහ අධීක්ෂණය සඳහා සෑම පීඨයක් තුළම අභ්‍යන්තර තත්ත්ව සහතික කුටියක් (IQAC) පිහිටුවා ඇත.

### දැක්ම/මෙහෙවර

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය තුළ ගුණාත්මක සංස්කෘතියකට මඟපාදන තිරසාර ගුණාත්මක වැඩිදියුණු කිරීමක් සඳහා අනුග්‍රහය දැක්වීම

### පරමාර්ථ

- විශිෂ්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම
- බාහිර ඇගයීම සඳහා සූදානම්වීම
- විශ්වවිද්‍යාලය තුළ සියලුම තත්ත්ව සහතික ආශ්‍රිත කටයුතු සම්බන්ධීකරණය කිරීම
- තත්ත්ව සහතික සමාලෝචන ක්‍රියාත්මක කිරීම
- ආයතනික ස්වයං-ඇගයීම් වාර්තා සකස් කිරීම
- විශ්වවිද්‍යාලය සඳහා තත්ත්ව සහතික පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම
- සියලුම පීඨ සහ අධ්‍යයන අංශ සඳහා තත්ත්ව සහතික පිළිබඳ උපදෙස් සැපයීම
- පීඨ මට්ටමේ තත්ත්ව සහතික ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ මඟපෙන්වීම
- කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා තත්ත්ව සහතික පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම
- ගුණාත්මකභාවය සහ තත්ත්ව සහතික අංශ ආයතනික සැලැස්මට ඇතුළත් කර ගැනීම
- විශිෂ්ට ව්‍යවහාර හඳුනා ගැනීම සහ ඒවා අනෙක් අධ්‍යන අංශ සමඟ බෙදාහදා ගැනීම

### කාර්ය මණ්ඩල තනතුරු

1. අධ්‍යක්ෂ
2. තත්ත්ව සහතික කවුන්සිලයේ ලේකම්

### වෙනත් තොරතුරු

- පශ්චාත්-උපාධි පීඨය හැරුණු කොට, පීඨ තත්ත්ව සහතික කුටි ස්ථාපිත කරන ලදී
- තත්ත්ව සහතික කවුන්සිලය ස්ථාපිත කරන ලදී, පළමු වැනි රැස්වීම 2021 දෙසැම්බර් මාසයේ දී පවත්වන ලදී

# 21. ගිණුම් 2021

**21.1.** පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

**21.2.** ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

**21.3.** මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම)

**21.4.** මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම)

**21.5.** මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2021

**21.6.** පීඨය අනුව එක් ශිෂ්‍යයෙක් සඳහා පිරිවැය 2017-2021

**21.7.** 2021 දී යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විස්තර



## 21.1. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2020 රු. | 2021 රු. |
|---|---|---|
| සේවක පාරිශ්‍රමිකය | 312,018,590 | 383,889,753 |
| ප්‍රවාහනය සහ යැපීම් | 144,743 | 85,748 |
| සැපයුම් සහ භාවිතා කළ පරිභෝජන භාණ්ඩ | 5,409,489 | 12,432,029 |
| නඩත්තුව | 2,436,852 | 6,766,066 |
| ගිවිසුම්ගත සේවා | 40,439,582 | 38,731,230 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 9,647,349 | 16,562,968 |
| එකතුව | **370,096,605** | **458,467,794** |

## 21.2. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2020 රු. | 2021 රු. |
|---|---|---|
| පුනරුත්ථාපනය සහ ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම | 17,269,727 | 68,838,175 |
| ස්ථාවර වත්කම් අත්කර ගැනීම | 19,738,625 | 29,650,460 |
| ඉදිකිරීම් ව්‍යාපෘති | 6,500,126 | 32,167,661 |
| මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය | 532,000 | - |
| එකතුව | **44,040,478** | **130,656,296** |

## 21.3. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම)

| විෂය | 2021 දී වෙන්කිරීම් රු. | 2021 දී වියදම් රු. | ඉතුරුම්/අතිරේක රු. |
|---|---|---|---|
| පුනරාවර්තන | 489,000,000 | 458,467,794 | 30,532,206 |
| ප්‍රාග්ධන | 118,800,000 | 130,656,296 | (11,856,296) |
| **එකතුව** | **607,800,000** | **589,124,090** | |

## 21.4. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම)

| ආදායම් මූලාශ්‍රය | එකතුව 2021 රු. |
|---|---|
| ණය සහ අත්තිකාරම්වලින් පොලිය | 793,084 |
| විවිධ ලැබීම් | 9,040,405 |
| ආයෝජනවලින් පොලිය | 19,395,484 |
| ලියාපදිංචි ගාස්තු | 534,150 |
| පරීක්ෂණ ගාස්තු | 69,850 |
| පුස්තකාල දඩ | 2,935 |
| වෛද්‍ය ගාස්තු | - |
| දේපළවලින් කුලිය | 126,845 |
| තොග අලෙවිය | 42,680 |
| ස්වයං-මූල්‍ය වැඩසටහන්වලින් ආදායම | 13,283,709 |
| **එකතුව** | **43,289,142** |

## 21.5 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2021

| විෂය | සූත්‍රය | එක් ශිෂ්‍යයෙක් සඳහා වියදම රු. |
|---|---|---|
| පුනරාවර්තන | පුනරාවර්තන වියදම<br>මුළු ශිෂ්‍යයින් | 845,881 |

## 21.6 පීඨය අනුව එක් ශිෂ්‍යයෙක් සඳහා පිරිවැය 2017 – 2021

| පීඨය | එක් ශිෂ්‍යයෙක් සඳහා පිරිවැය (රු.) | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| GWAI/FIM | 662,460 | 692,702 | 681,810 | 713,095 | 845,881 |

## 21.7 2021 දී යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විස්තර

| ව්‍යාපෘතියේ නම | කැබිනට් මණ්ඩලයේ අනුමත මුළු පිරිවැය ඇස්තමේන්තුව (TCE) රු. | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| අධ්‍යයන ගොඩනැගිල්ල ඉදිකිරීම | මිලි. 134 | මිලි. 122 |

## 22. මූල්‍ය ප්‍රකාශන – 2021



## ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

## 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

### පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1 | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය | 01 |
| 2 | මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය | 02 |
| 3 | ශුද්ධ වත්කම්/ සම කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය | 03 |
| 4 | මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය | 04 |
| 5 | වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 05-17 |
| 6 | අයවැය හා තථ්‍ය සැසඳීම පිළිබඳ ප්‍රකාශනය | 18 |

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය**

**2021 දෙසැම්බර් 31වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

*(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් වේ)*

| විස්තරය | සටහන් | 2021 | | 2020 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 2 | 59,389,852 | | 89,770,023 | |
| විවිධ ණයකරුවෝ | 3 | 2,428,430 | | 1,696,430 | |
| ණය හා අත්තිකාරම් | 4 | 18,538,751 | | 19,168,250 | |
| බඩු ලේඛනය | 5 | 13,300,902 | | 2,372,060 | |
| පූර්ව ගෙවීම් | 6 | 102,110 | | 1,422,010 | |
| කෙටි කාලීන ආයෝජන | | 252,310,840 | | 189,682,951 | |
| වෙනත් ජංගම වත්කම් | 7 | 2,297,269 | **348,368,154** | 2,206,983 | **306,318,707** |
| | | | | | |
| **ආයෝජන** | | | | | |
| ස්ථාවර වත්කම් | | | 137,486,855 | | 114,853,093 |
| | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ පිරියත හා උපකරණ | 8 | 627,201,046 | | 552,533,037 | |
| කෙරී ගෙන යන වැඩ | 9 | 78,230,870 | | 46,635,209 | |
| ප්‍රාග්ධන අත්තිකාරම් | | 13,696,625 | | 2,316,225 | |
| අස්පර්ෂණීය වත්කම් | 10 | 157,284 | | 243,323 | |
| වෙනත් | | 170,500 | 719,456,325 | 236,500 | 601,964,295 |
| **මුළු වත්කම්** | | | **1,205,311,334** | | **1,023,136,095** |
| | | | | | |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| සම්මුච්ඡිත වියදම් | 11 | 8,155,800 | | 5,605,470 | |
| කළ යුතු ගෙවීම් | 12 | 1,972,633 | | 978,955 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු හා වෙනත් | 13 | 25,669,049 | | 41,480,562 | |
| | | | **35,797,482** | | **48,064,987** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 14 | 142,636,305 | 142,636,305 | | 132,403,243 |
| **මුළු වගකීම්** | | | **178,433,787** | | **180,468,230** |
| | | | | | |
| **මුළු ශුද්ධ වත්කම්** | | | **1,026,877,548** | | **842,667,865** |
| **ශුද්ධ වත්කම්/ සමකොටස්** | | | | | |
| ප්‍රාග්ධනය (ගෙවූ) | | 539,752,002 | | 416,337,418 | |
| ප්‍රාග්ධනය (නොගෙවූ) | | 202,902,628 | | 214,758,924 | |
| පොදු සංචිත | | (10,439,360) | | (58,771,841) | |
| සීමා කළ අරමුදල් සහ ප්‍රදාන | 15 | 64,111,926 | | 48,954,236 | |
| සංචිත ප්‍රත්‍යාගණනය හා ප්‍රදාන | 16 | 230,550,352 | | 221,389,128 | |
| **මුළු ශුද්ධ වත්කම/ සම කොටස්** | | | **1,026,877,548** | | **842,667,865** |

මෙම මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ සහ වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානවල අවශ්‍යතාවන්ට අනුකූල වේ.

සී. ජී. කොතලාවල
**මූල්‍යාධිකාරී**

මහාචාර්ය රන්ජන ඩබ්ලිව්. සෙනෙවිරත්න
**උපකුලපති**

විශ්වවිද්‍යාලයේ පාලන සභාව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකීම දරයි.

සිරිමල් සේනාරත්න මහතා
**පාලක සභා සාමාජික**

ප්‍රශාන්ත ලාල් ද අල්විස් මහතා
**පාලක සභා සාමාජික**

2022 පෙබරවාරි මස 25 වැනි දින
යක්කල

1

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය**

2021 දෙසැම්බර් 31වැනි දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

(*සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් වේ*)

| | සටහන් | 2021 | | 2020 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **ආදායම** | | | | | |
| පුනරාවර්තන ප්‍රදාන | | | 489,000,000 | | 391,538,000 |
| ප්‍රාග්ධන වත්කම් ක්‍රමක්ෂය | | | 41,092,657 | | 33,562,711 |
| වෙනත් ආදායම් | | | | | |
| (1) ණය සහ අත්තිකාරම් පොලී | | 793,084 | | 737,598 | |
| (2) විවිධ ලැබීම් | 17 | 9,040,405 | | 1,131,586 | |
| (3) ආයෝජන පොලිය | | 19,395,484 | | 17,793,318 | |
| (4) ලියාපදිංචි ගාස්තු | | 534,150 | | 371,000 | |
| (5) විභාග ගාස්තු | | 69,850 | | 25,300 | |
| (6) පුස්තකාල දඩ මුදල් | | 2,935 | | 22,019 | |
| (7) වෛද්‍ය ගාස්තු | | - | | 2,000 | |
| (8) දේපළ කුලිය | 18 | 126,845 | | 186,257 | |
| (9) තොග විකුණුම | | 42,680 | | 1,913 | |
| (10) මහපොල හා ශිෂ්‍යාධාර | 19 | | | - | |
| (11) ස්වයං-මූල්‍ය වැඩසටහන්වලින් ආදායම | | 13,283,709 | 43,289,143 | 13,536,282 | 33,807,272 |
| **මුළු ආදායම** | | | **573,381,800** | | **458,907,983** |
| | | | | | |
| **වියදම්** | | | | | |
| (1) පුද්ගලික පඩිනඩි | | 383,889,753 | | 312,018,590 | |
| (2) ගමන් වියදම් සහ යැපීම් දීමනාව | | 85,748 | | 144,743 | |
| (3) සැපයුම් හා භාවිතා කළ පාරිභෝජන | | 12,432,029 | | 5,409,489 | |
| (4) නඩත්තුව | | 6,766,066 | | 2,436,852 | |
| (5) කොන්ත්‍රාත් සේවා | | 38,731,230 | | 40,439,582 | |
| (6) පර්යේෂණ හා සංවර්ධනය | | - | | - | |
| (7) ක්ෂයවීම් | | 41,092,657 | | 33,562,711 | |
| (8) වෙනත් මෙහෙයුම් වියදම් | | 16,562,968 | | 9,647,349 | |
| (9) ස්වයං-මූල්‍ය වැඩසටහන් සඳහා වියදම් | | 13,400,375 | | 8,390,551 | |
| (10) උත්පාදිත අරමුදල් වියදම් | | 3,186,369 | | 1,507,699 | |
| **මුළු වියදම්** | | | **516,147,195** | | **413,557,566** |
| | | | | | |
| | | | | | |
| **වර්ෂය සඳහා අතිරික්තය/ (ඌනතාව)** | | | **57,234,605** | | **45,350,417** |

2

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය**
**2021 දෙසැම්බර් 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ශුද්ධ වත්කම්/ සම කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය**

| විෂය ක්ෂේත්‍රය | ගෙවූ ප්‍රාග්ධනය රු. | නොගෙවූ ප්‍රාග්ධනය රු. | ප්‍රත්‍යාගණන සංචිතය රු. | පොදු සංචිතය රු. | සංචිත හා සීමා කළ අරමුදල් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| **2019 දෙසැම්බර් 31වැනි දිනට ශේෂය** | **376,365,443** | **178,989,779** | **167,336,443** | **(128,687,237)** | **19,642,014** | **613,646,442** |
| වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය)<br>මාරු කිරීම්/ ශුද්ධ චලනයන් | 39,971,975 | 35,769,145 | 54,052,685 | 45,350,417 | 29,312,222 | 204,456,444 |
| පොදු සංචිත ගිණුමට සිදු කළ ගැලපීම් - 2020 | | | | 33,231,682 | - | 33,231,682 |
| | | | | (8,666,703) | - | (8,666,703) |
| **2020 දෙසැම්බර් 31දිනට ශේෂය** | **416,337,418** | **214,758,924** | **221,389,128** | **(58,771,841)** | **48,954,236** | **842,667,865** |
| දේපළ ප්‍රත්‍යාගණනය මත ලාභය/ අලාභය | | | 9,614,184 | | | 9,614,184 |
| වසර සඳහා අතිරික්තය/ (හිඟය) | | | | 57,234,604 | | 57,234,604 |
| මාරු කිරීම්/ ශුද්ධ චලනයන් | 123,414,584 | (11,856,296) | | | 15,157,690 | 126,715,978 |
| පොදු සංචිත ගිණුමට සිදු කළ ගැලපීම් - 2021 | | | (452,960) | **1,597,993** | | 1,145,033 |
| ස්වයං-මූල්‍ය කටයුතු සඳහා මාරු කිරීම් | | | | **(10,500,116)** | | **(10,500,116)** |
| **2021 දෙසැම්බර් 31දිනට ශේෂය** | **539,752,002** | **202,902,628** | **230,550,352** | **10,439,360** | **64,111,926** | **1,026,877,548** |

3

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය**
**2021 දෙසැම්බර් 31වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය**

| විස්තරය | 2021<br>රු. 000' | 2020<br>රු. 000' |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාවලිවලින් මූල්‍ය ප්‍රවාහ** | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්තය (හිඟය) | 57,235 | 45,350 |
| **එකතු කළා: මූල්‍ය නොවන කටයුතු** | | |
| ක්ෂයවීම් | 35,637 | 33,563 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන - පාරිතෝෂිකය | 26,091 | 9,578 |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | (35,637) | (33,563) |
| අස්පර්ශණීය වත්කම් ක්‍රමක්ෂය | 152 | 612 |
| **වැඩ ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ප්‍රතිලාභ** | **83,478** | **55,540** |
| සිදු කළ ගෙවීම්වල වැඩිවීම/ (අඩුවීම) | 3,544 | (55,638) |
| බඩු ලේඛනවල (වැඩිවීම)/අඩු කිරීම | 10,929 | (900) |
| ගනුදෙනු හා වෙනත් ලැබීම්වල අඩුවීම (වැඩිවීම)/අඩු කිරීම | (1,127) | (646) |
| ගනුදෙනු හා වෙනත් ගෙවීම්වල වැඩිවීම (වැඩිවීම/ (අඩුවීම) | (15,811) | 8,249 |
| **මෙහෙයුම්වලින් උත්පාදිත මුදල** | **81,013** | **6,480** |
| පාරිතෝෂික ගෙවීම් | (15,858) | (3,820) |
| **මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **65,154** | **2,660** |
| **ආයෝජන කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය** | | |
| පිරියත හා උපකරණ මිල දී ගැනීම | (99,489) | (27,453) |
| කෙරී ගෙන යන වැඩ | (31,596) | 26,501 |
| වෙනත් හා ප්‍රාග්ධන අත්තිකාරම් | (11,380) | 21,951 |
| ශුද්ධ ආයෝජනය | (85,262) | (54,528) |
| **ආයෝජන කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **(227,727)** | **(33,529)** |
| **මූල්‍ය කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය** | | |
| පෙර වර්ෂයේ ගැලපීම් (ශුද්ධ) | (1,766) | - |
| ලැබූ ප්‍රදාන | 118,800 | 108,000 |
| සීමා කළ අරමුදල් | 15,158 | 605 |
| **මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **132,192** | **108,605** |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | (30,381) | 77,931 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දේ | 89,770 | 11,840 |
| කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දේ | **59,389** | **89,770** |

4

**<u>ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය</u>**
**<u>වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්</u>**

**1.** ආයතනික තොරතුරු

**1. 1 පදිංචිය හා නෛතික ස්වභාවය**

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ නිකුත් කළ 1995 පෙබරවාරි මස 23වැනි දිනැති අංක 859/12 දරන රජයේ ගැසට්පත්‍රය ප්‍රකාරව 1995 මාර්තු මස 01වැනි දින සිට 2021 පෙබරවාරි මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අහෝසි කරනු ලබන තෙක් කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ විද්‍යායතනයක් ලෙස පිළිගනු ලැබීය.

2020.07.08 වැනි දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, යක්කල සියලුම පහසුකම්වලින් අනූන විශ්වවිද්‍යාලයක තත්ත්වයට ඉහළ නැංවීම සඳහා තීරණය කරන ලද අතර ඒ අනුව විද්‍යායතනය 2021.03.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" නමින් සම්පූර්ණ පහසුකම් සහිත විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීම පිණිස 2020 ඔක්තෝබර් මස 28 දිනැති අංක 2199/12 දරන රජයේ ගැසට්පත්‍රය ප්‍රකාරව නියෝගය නිකුත් කරන ලදී. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය 2021.03.01 වැනි දින සිට ස්ථාපිත කරනු ලැබ එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී.

විශ්වවිද්‍යාලය කොළඹ- මහනුවර මාර්ගයේ කොළඹ නගරයෙන් කිලෝ මීටර 30ක් පමණ දුරින් යක්කල නගරයේ දී පිහිටුවා ඇත. නව විශ්වවිද්‍යාලයට ප්‍රථම උපාධි වැඩසටහන් 11ක් සහ පශ්චාත් උපාධි වැඩසටහන් 10 පමණ පිරිනමනු ලබන, අධ්‍යයන අංශ 14කින් සමන්විත පීඨ හතරක් ඇතුළත් වේ. විශ්වවිද්‍යාලයට 2020 වර්ෂයේ උසස් පෙළ ප්‍රතිඵල මත පදනම්ව ප්‍රථම උපාධි මට්ටමේ ශිෂ්‍යයින් 600ක් පමණ ඇතුළත් කර ගැනීමට යෝජිත වන අතර ශිෂ්‍ය බඳවා ගැනීම ක්‍රමානුකූලව වැඩි කිරීමට අපේක්ෂා කරනු ලබයි.

සමාලෝචිත 2021 මූල්‍ය වර්ෂය අතරතුර දී, විශ්වවිද්‍යාලය පොදු මුද්‍රාවක් සහ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් වේ. 2021 වර්ෂය සඳහා වාර්ෂික අයවැය වෙන්කිරීම සහ අරමුදල් බෙදාහැරීම ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය ශීර්ෂය යටතේ සිදු කරන ලදී.

**1.2 විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍යය සහ ක්‍රියාකාරකම්**

2020 ඔක්තෝබර් මස 28 දිනැති අංක 2199/12 දරන රජයේ ගැසට්පත්‍රය ප්‍රකාරව ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ස්ථාපිත කරනු ලැබුවේ දේශීය වෛද්‍ය විද්‍යාව, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය සහ දේශීය සමාජීය විද්‍යා සහ කළමනාකර අධ්‍යයන ශාඛාවන්හි උසස් අධ්‍යාපනය ලබාදීමේ, දියුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ කාර්යයන් සඳහා වේ.

තව ද, තෝරාගත් විෂයන් සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ලබා ගැනීමේ හැකියාව ඇතිව ශිෂ්‍යයන්ට ඉතා හොඳ සාමාන්‍ය අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණ ඇතිව විෂයයන් රාශියකට අදාළ පාඨමාලා විශ්වවිද්‍යාලය විසින් ඇති කළ බවත් දේශීය සම්පත් පදනම තුළ වටිනාකම් නිර්මාණය කිරීම විශ්වවිද්‍යාලය වැඩි අවධානයක් යොමු කළ යුතු බවත් එයින් නියම කර ඇත.

**1.3 විශ්වවිද්‍යාලයේ පාලක සභාව**

පාලක සභාව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වගකීම දරනු ලැබේ.

### 1.4 නිකුත් කිරීම සඳහා බලයදීමේ දිනය

විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය මතමූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය දී ඇත.

## 2. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවලට 2021 වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහය, ශුද්ධ වත්කම්/ සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශන, ගිණුම්කරන ප්‍රතිපත්ති සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඇතුළත් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (අදාළ වන පරිදි SLPSAS I වැනි වෙළුම, II වැනි වෙළුම සහ III වැනි වෙළුම) අනුකූලව සකස් කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හැරුණු කොට මූල්‍ය ප්‍රකාශන සමුච්චිත පදනම මත සකස් කර ඇත.

#### 2.1.1 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර යෝග්‍ය අවස්ථා හැරුණු කොට අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් සිදු කර ඇත. වත්කම් හා වගකීම්වල සාපේක්ෂ ද්‍රවශීලීත්වය නිරූපණය කරන පරිදි ඒවා කාණ්ඩ කර ඇත.

#### 2.1.2 තුලනාත්මක තොරතුරු

ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීම වැඩිදියුණු කිරීම පිණිස සහ කාලපරිච්ඡේද අතර තුලනාත්මකභාවය වැඩිදියුණු කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සියලුම අගයන් සඳහා කලින් කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක, විස්තරාත්මක තොරතුරු ඇතුළත් තුලනාත්මක තොරතුරු හෙළිදරව් කරනු ලැබේ. 2021 වර්ෂය සඳහා අයවැය වෙන්කිරීම් එක් ශීර්ෂයක් යටතේ සිදු කර ඇති බැවින් සහ සමාලෝචිත වර්ෂය තුළ දී විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීමත් සමඟ කිසිදු ප්‍රධාන මූල්‍ය ප්‍රතිපත්ති වෙනස්කම් හෝ වර්ගීකරණ සිදු වී නොමැත.

#### 2.1.3 අඛණ්ඩ ක්‍රියාකාරීත්වය

පූර්වේක්ෂණය කළ හැකි අනාගතය සඳහා විශ්වවිද්‍යාලය අඛණ්ඩ ක්‍රියාකාරීත්වයකින් පවතින උපකල්පනය මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අඛණ්ඩව පැවතීම සඳහා සිය හැකියාව පිළිබඳව ඇගයීමක් සිදු කර ඇති අතර පූර්වේක්ෂණය කළ හැකි අනාගතයක් සඳහා සිය කටයුතු පවත්වා ගෙන යාම පිණිස සම්පත් පවතින බවට සෑහීමකට පත් වී ඇත. තව ද, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට ඇති හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සැලකිය යුතු අවිනිශ්චිතතාවන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ පාලක සභාව නොදනී.

#### 2.1.4 ගනුදෙනු කරන ව්‍යවහාර මුදල

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන එහි කෘත්‍ය හා වාර්තාකරණ ව්‍යවහාර මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ. සියලුම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලේ අගයට වටයා ඉදිරිපත් කර ඇත.

### 2.1.5 ඇස්තමේන්තු සහ තීන්දු භාවිතා කිරීම

අදාළ පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා කළමනාකාරිත්වය මඟින් ප්‍රතිපත්ති යොදා ගැනීමට සහ වත්කම් හා වගකීම්වලට, ආදායම හා වියදමට වාර්තා කළ අගයන්ට බලපාන තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන ඇති කර ගැනීමට අවශ්‍ය වේ. ඇස්තමේන්තු හා ආශ්‍රිත උපකල්පන ඓතිහාසික අත්දැකීම් හා පවතින තත්ත්වයන් යටතේ යුක්තිසහගත බවට විශ්වාස කරන විවිධ වෙනත් සාධක මත පදනම් වේ. තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ උපකල්පන කෙරී ගෙන යන පදනම මත සමාලෝචනය කරනු ලැබේ.

## 2.2. වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති සාරාංශය

### 2.2.1 දේපළ, පිරියත හා උපකරණ

#### (අ) හඳුනා ගැනීම සහ මිනුම

දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකමට කිසියම් සමුච්චිත ක්ෂයවීම සඳහා අඩු කිරීම් සිදු කිරීමෙන් පසුව දරන ලද පිරිවැයට හෝ සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ සියලුම අයිතම මුල් අවස්ථාවේ දී පිරිවැයට වාර්තා කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ අයිතම පසුව ප්‍රත්‍යාගනනය කරන විට එවැනි වත්කම්වල සියලුම පන්ති ප්‍රත්‍යාගනනය කරනු ලැබේ.

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ කලින් හඳුනා ගත් එම වත්කමේ ප්‍රත්‍යාගණන අඩුවීමක් ආපසු හැරවීමක් නොවන තාක් දුරට හැරුණු කොට වත්කමක් ප්‍රත්‍යාගණනය කළ විට එහි රැගෙන යන අගයේ කිසියම් වැඩිවීමක් ඍජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලබන අතර එවැනි අවස්ථාවක දී වැඩිවීම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

එකම වත්කමක පෙර අතිරික්තයක් හිලව් කරන ඕනෑම ප්‍රත්‍යාගණන හිඟයක් ප්‍රත්‍යාගණන සංචිතයේ අතිරික්තය සම්බන්ධයෙන් සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවල වියදමක් ලෙස හඳුනා ගෙන ඇති ඕනෑම වියදමක් සම්බන්ධයෙන් ඍජුව හිලව් කරනු ලැබේ.

විකිණූ වත්කම ආශ්‍රිත ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් සමුච්චිත අතිරික්තයට හෝ හිඟයට මාරු කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ අයිතම ප්‍රතිස්ථාපනය කළ විට, බැහැර කළ විට හෝ එහි භාවිතාවෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා ගනු ලබන්නේ නැත; වත්කම හඳුනා නොගැනීමෙන් මතුවන කිසියම් ලාභයක් හෝ අලාභයක් එකී වත්කම හඳුනා නොගන්නා වර්ෂය තුළ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

අයිතිය ඇති ගොඩනැගිලි විශ්වවිද්‍යාලයේ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන අතර ඒ අනුව ආයෝජන දේපළ අර්ථකථනයට ඇතුළත් නොවේ.

#### (ආ) පසු කාලීන වියදම්

පසු කාලීන වියදම මුදල් බවට හරවනු ලබන්නේ වියදම් මඟින් විශ්වවිද්‍යාලයට එකතු වන කිසියම් අදාළ වත්කමක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභය හෝ සේවා විභවය වැඩි කරන්නේ නම් පමණි. එදිනෙදා සේවා සැපයීම සඳහා වූ පිරිවැය මූලික වශයෙන් ශ්‍රමය හා පරිභෝජන භාණ්ඩ සඳහා වැය වන පිරිවැය වන අතර සුළු කොටස්වල පිරිවැය ඇතුළත් විය හැකිය. මෙම වියදම්වල අරමුණ බොහෝවිට දේපළ, පිරියත හා උපකරණ "අළුත්වැඩියාව සහ නඩත්තුව" ලෙස විස්තර කරනු ලබන අතර මෙම වියදම් දරනු ලැබූ විට වියදමක් ලෙස මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගනී.

**(ඈ) ක්ෂයවීම**

සින්නක්කර ඉඩම් හැරුණු කොට, වත්කම් ඇස්තමේන්තුගත ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය මත එම වත්කම්වල පිරිවැය කපා හැරීම සඳහා වාර්ෂිකව පහත සඳහන් ප්‍රමාණවලින් සරල රේඛීය පදනම මත මූල්‍ය ප්‍රතිඵල ප්‍රකාශනයට ක්ෂයවීම් ඇතුළත් කොට ඇත. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය පහත දැක්වෙන පරිදි වේ:

| විස්තරය | වර්ෂ |
|---|---|
| ගොඩනැගිලි | 20 |
| ගෘහභාණ්ඩ හා තිරවුරු | 10 |
| උපකරණ | 10 |
| කාර්යාල උපකරණ | 05 |
| මෝටර් වාහන | 05 |
| පුස්තකාල පොත් සහ වාරසඟරා | 05 |
| විද්‍යාගාර, ශික්ෂණ උපකරණ | 05 |
| ලෝගු | 05 |

වත්කමක් භාවිතය සඳහා ලබා ගැනීමට ඇති විට ක්ෂයවීම ආරම්භ වන අතර එය බැහැර කළ විට හෝ ස්ථිර වශයෙන්ම ආපසු ගත් විට අවසාන වේ.

**(ඈ) කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ**

කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ පිරිවැයට ප්‍රකාශ කරනු ලැබේ. මුදල් බවට හැරවීමට අපේක්ෂාවෙන් ඇති ගොඩනැගිලි ඉදිකිරීම, ගොඩනැගිලි නවෝත්පාදන වැඩ, විශාල පිරියත හා යන්ත්‍රෝපකරණ හා පද්ධති ගොඩනැගීම මත දැරූ ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

**(ඉ) ප්‍රදානය කළ වත්කම්**

දේපළ පිරියත සහ උපකරණ ව්‍යාපෘතියක කොටසක් ලෙස සීමිත අරමුදල් හෝ විදේශ අරමුදල් සම්පාදක ව්‍යාපෘති හරහා මිල දී ගන්නා විට ව්‍යාපෘතිය අවසන් කරන තෙක් හෝ ව්‍යාපෘතිය අවසානයේ දී වත්කම ප්‍රතිලාභියාට භාර නොදෙන්නේ නම් හෝ මුල් දායකයාට ආපසු ලබා දෙන්නේ නම්, වත්කමේ පිරිවැය දේපළ පිරියත සහ උපකරණවලට ඇතුළු නොකරයි.

### 2.2.2 අස්පර්ෂණීය වත්කම්

විශ්වවිද්‍යාලයේ අස්පර්ශණීය වත්කම්වලට පරිගණක මෘදුකාංගවල වටිනාකම ඇතුළත් වේ. අදාළ වත්කමේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි වන්නේ නම් සහ එයට ආවේණික අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන්නේ නම් පමණක් අස්පර්ෂණීය වත්කමක් ලෙස හඳුනා ගන්නා අතර අස්පර්ෂණීය වත්කම් ඇස්තමේන්තුගත ජීවිත කාලය පුරාවට ක්‍රමක්ෂය කරනු ලැබේ.

### 2.2.3 ආයෝජන

ස්ථාවර තැන්පතුවල ආයෝජන ගනුදෙනු මිලට හඳුනා ගනු ලබන අතර ලැබූ පොළිය සමඟ පිරිවැයට අදාළ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ නිරූපණය කරනු ලැබේ. සියලුම ස්ථාවර තැන්පතු රාජ්‍ය බැංකුවල සිදු කර තිබේ.

ලැබූ පොළිය හෝ වසර සඳහා වූ ආයෝජනවලින් ලැබෙන පොළිය වසර ඇතුළත එවැනි ආයෝජන සඳහා බැංකුවෙන් ප්‍රකාශිත අනුපාතය මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත.

### 2.2.4 භාණ්ඩ ලේඛන (ගබඩා අත්තිකාරම්)

භාණ්ඩ ලේඛන අඩුම පිරිවැය හෝ ශුද්ධ හඳුනාගත හැකි අඩුම වටිනාකම මත වටිනාකම් දක්වනු ලැබේ.

භාණ්ඩ ලේඛණවල එක් එක් කාණ්ඩයේ පිරිවැය FIFO ක්‍රමය මඟින් තීරණය කරනු ලැබේ.

### 2.2.5 මුදල් හා මුදල් සමාන දෑ

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇති මුදල් හා මුදල් සමාන දෑ යන්නට බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල් ඇතුළත් වේ.

වක්‍ර ක්‍රමය යටතේ සකස් කරනු ලබන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යය සඳහා මුදල් හා මුදල් සමාන දෑ යන්නට බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල් ඇතුළත් වන අතර ඉහත විස්තර කළ පරිදි කෙටි කාලීන තැන්පතු විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමනාකරණයේ අන්තර්ගත කොටසක් ලෙස සලකනු ලැබේ.

### 2.2.6 විවිධ ණයකරුවෝ

"ණය" යන්නෙන් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් හැඳින්වේ. මෙම ණය නිකුත් කරනු ලබන්නේ ඇපයක් මතය. තව ද ණය ශේෂයන් සේවකයාගේ මාසික වැටුපෙන් අය කරනු ලැබේ. සේවකයා සේවය අතහැර යන අවස්ථාවක දී එවැනි මුදල් අගයන් සේවකයාගේ අර්ථසාධක අරමුදල් ශේෂයෙන් සම්පූර්ණයෙන්ම ආපසු අය කර ගනු ලැබේ. එබැවින් බොල් ණය ආපසු අය කර ගැනීම සඳහා විධිවිධාන නොමැත.

### 2.2.7 කෙටි කාලීන ආයෝජන

මාස තුනක හෝ ඊට අඩු කාලයකින් කල් පිරෙන තැන්පතු නියෝජනය කරන සහ වටිනාකම වෙනස්වීම සම්බන්ධයෙන් වැදගත් නොවන අවදානමකට භාජනය වන කෙටි කාලීන ආයෝජන ලැබෙන පොළිය සහ පිරිවැය මත සලකා බලනු ලැබේ.

### 2.2.8 පොදු සංචිතය

පොදු සංචිතයට වර්ෂය තුළ එකතු වූ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ අතිරික්තයන් සහ හිඟ ඇතුළත් වේ.

### 2.2.9 සීමා කළ අරමුදල් සහ ප්‍රදාන

සීමා කළ අරමුදල් සහ ප්‍රදාන පර්යේෂණ ප්‍රදාන සහ විශේෂිත කාර්යයන් සඳහා වෙන් කර ඇති ලැබූ වෙනත් ප්‍රදාන නිරූපණය කරයි.

### 2.2.10 සේවක ප්‍රතිලාභ

#### (i) නිර්මිත ප්‍රතිලාභ සැලසුම්

විශ්වවිද්‍යාල පනතේ 75 (1) වගන්තිය අනුව ගුරුවරුන් හැරුණු කොට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සේවකයන්ගේ (අනධ්‍යයන කාර්ය මණ්ඩලය) විශ්‍රාමයාමේ වෛකල්ප වයස අවුරුදු 57ක් වන අතර කෙසේවුව ද, යම් නිලධරයෙක් මෙම වයස් සීමාව ඉක්මවා සේවය කිරීමට අදහස් කරන්නේ නම්, 2022.01.01 දින සිට ඔහුට හෝ ඇයට අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 62 වන තෙක් සේවය කළ හැකිය. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයට අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 වන තෙක් සේවය කළ හැකිය. ඉහත සේවා කාලය 2021 වර්ෂය සඳහා පාරිතෝෂික දීමනා සඳහා පදනමක් ලෙස සලකනු ලැබේ.

විශ්වවිද්‍යාලය මඟින් සුදුසුකම් ඇති සියලු සේවකයින් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත යටතේ දක්වා ඇති පරිදි ප්‍රතිපාදන සැලැස්මක් අනුගමනය කරනු ලැබේ. අවම වශයෙන් වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා පාරිතෝෂික දීමනා ගෙවීම සිදු කර ඇත.

කෙසේවුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත යටතේ වගකීම් පැන නඟින්නේ අවම වශයෙන් වසර පහක අඛණ්ඩ සේවාවක් සම්පූර්ණ කළ සේවකයින් සඳහා පමණක් වන අතර වගකීම් සඳහා බාහිරව අරමුදල් සපයනු නොලැබේ. වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම-නොවන වගකීම් යටතේ කාණ්ඩගත කර ඇත.

2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ වන ආකාරයට ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතිවලට (SLPAS 19) අනුකූලව පාරිතෝෂික දීමනා ගණනය කරනු ලැබේ.

**(ii) නිර්මිත දායකත්ව සැලසුම්**

විශ්වවිද්‍යාලයේ සියලුම සේවකයින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුකූලව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් වෙති. විශ්වවිද්‍යාලය මූලික වැටුපෙන් සහ දීමනාවලින් 15%ක් එම අරමුදලට දායකත්වය දක්වයි. තව ද 1999 සැප්තැම්බර් මස 01වැනි දින හෝ ඊට පසු බඳවා ගත් සේවකයින් මෙම දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලයේ සාමාජිකයින් වෙති. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සිදු කරන 15%ක දායකත්වයෙන් 8%ක් මාසිකව දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලට මාරු කරනු ලැබේ. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

විශ්වවිද්‍යාලය සෑම සේවකයෙක්ගේම වැටුප් සහ දීමනාවලින් 3%ක් සේවක භාර අරමුදලට දායක කරනු ලබන අතර මෙම අරමුදල නිර්මිත දායකත්ව සැලැස්ම යටතේ වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

නිර්මිත දායකත්ව සැලැසුම් වෙත සිදු කරන දායකත්වය සඳහා වූ බැඳීම් ඒවා මතු වන විට සහ මතු වන අවස්ථාවල දී මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ වියදමක් ලෙස වට්ටම් නොකළ පදනම මත හඳුනා ගනු ලැබේ.

**2.2.10 ආදායම හඳුනා ගැනීම**

ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන ප්‍රමාණයට සහ එය විශ්වාසදායක අන්දමින් මැනිය හැකි තාක් දුරට ආදායම හඳුනා ගනී.

ශිෂ්‍යයින්ගෙන් ලැබූ බඳවා ගැනීමේ ගාස්තු, වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු සහ වෛද්‍ය ගාස්තු ලියාපදිංචිය නිමා කරන අවස්ථාවේ ආදායම සහ ලැබීමේ පදනම මත ආදායම ලෙස හඳුනා ගනී.

විභාග, සම්මන්ත්‍රණ, පාඨමාලා සහ වෙනත් අධ්‍යාපනික කටයුතු පැවැත්වීම සඳහා වූ ගාස්තු එවැනි කටයුතු අවසන් කළ විට ආදායම ලෙස හඳුනා ගනී.

ස්වයං-මූල්‍ය වැඩසටහන් සඳහා ගාස්තු වර්ෂය අවසානයේ දී එවැනි පාඨමාලා නිමා කළ අදියර මත පදනම්ව ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනී. අනාගත කාලපරිච්ඡේදවලට සම්බන්ධ දේශන ගාස්තු සහ ගෙවීම් ප්‍රවර්තන වගකීම් යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත. පොළී ආදායම සහ කුලී ආදායම උපචිත පදනම මත හඳුනා ගනී.

ශ්‍රී ලංකා ආණ්ඩුවේ මහා භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රදාන අදාළ පිරිවැය හඳුනා ගත් කාලපරිච්ඡේදය තුළ ආදායම ලෙස හඳුනා ගනී.

පසු කාලීන කාලපරිච්ඡේදවල දී වියදම් කරන වත්කම් අත්කර ගැනීමට උපයෝජනය කළ රජයේ ප්‍රදාන විලම්භිත ආදායම (වියදම් නොකළ ප්‍රාග්ධනය) ලෙස හඳුනා ගනී. මුදල් හා මුදල් සමාන දෑ, අඩු වගකීම් (ලැබූ ප්‍රදාන සම්බන්ධ වගකීම් හැරුණු කොට) ඇතුළු වෙනත් වත්කම්වලින් නිරූපණය කරන රජයේ ප්‍රදාන වගකීම් ලෙස හඳුනා ගනී. විලම්භිත ආදායම ලෙස හඳුනා ගන්නා රජයේ ප්‍රදාන අදාළ වත්කමේ ප්‍රයෝජනවත් කාලය අවසානයේ දී ක්‍රමක්ෂය කර ඇත.

### 2.2.11 වියදම හඳුනා ගැනීම

වියදම්, දැරූ පිරිවැය සහ ආදායමේ නිශ්චිත අයිතමවල ඉපැයීම් අතර ඍජු සම්බන්ධතාව මත පදනම්ව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවල හඳුනා ගනු ලැබේ. ව්‍යාපාර කටයුතු ඉටු කිරීමේ දී සහ දේපළ, පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්ත්වයකින් පවත්වා ගෙනයාමේ දී දැරූ සියලුම වියදම් මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත. මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා විශ්වවිද්‍යාලයේ කාර්යසාධනයේ ලක්ෂණ සාධාරණය ඉදිරිපත් කිරීමේ පදනම මත "වියදම් කටයුතු" ක්‍රමය යොදා ගෙන ඇත.

සියලුම වැදගත් වගකීම් සහ අවිනිශ්චිත වගකීම් සලකා බලන අතර අවශ්‍ය අවස්ථාවල දී මෙම මූල්‍ය ප්‍රකාශනවල වෙනස්කම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

### 2.2.14 වාර්තාකරණ දිනට පසුව සිදුවීම්

වාර්තාකරන දිනට පසු එන සියලුම වැදගත් සිදුවීම් සලකා බලන ලදුව අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශන සටහන්වලට නිසි ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

### 2.2.15 ප්‍රාග්ධන වගකීම් සහ අවිනිශ්චිත වගකීම්

සියලුම වැදගත් වගකීම් සහ අවිනිශ්චිත බැරකම් සැලකිල්ලට ගනු ලබන අතර අවශ්‍ය අවස්ථාවල දී මෙම මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

(2012 වර්ෂයේ දී නිමා කළ) පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ අවසාන බිල්පත මේ වන තෙක් විශ්වවිද්‍යාලයට ලැබී නොමැත. ඉහත ව්‍යාපෘතිය සඳහා එකී දිනය දක්වා දැරූ ඉදිකිරීම් පිරිවැය සුදුසු පරිදි ගණනය කර ක්ෂය කර ඇත.

### 2.2.16 ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු

මෙම මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින් ගන්නා කිසියම් තීරණයකට යුක්තිසහගතව බලපෑම් කළ හැකි කිසිදු වැදගත් ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනුවක් වර්ෂය තුළ දී සිදු වී නොමැත.

### 2.2.17 බදු අය කිරීම්

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය අනුව වි විශ්වවිද්‍යාලය බදු ගෙවීමෙන් නිදහස් කර ඇත.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

*මෙම සටහන් මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වන අතර එම ප්‍රකාශන සමඟ එකට කියැවිය යුතුය.*

| | 2021 | | 2020 |
|---|---|---|---|
| **සටහන - 02** | රු. | | රු. |
| **මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| බැංකු ශේෂය | | | |
| ගිණුම් අංක 333-1001-1-0000059 | 42,446,403 | | 63,697,808 |
| ගිණුම් අංක 333-1002-0-0000059 | 5,043,237 | | 26,072,216 |
| ගිණුම් අංක 333-1001-200-64705 | 11,900,213 | | |
| **එකතුව** | 59,389,852 | | 89,770,023 |
| | | | |
| **සටහන - 03** | | | |
| **විවිධ ණයගැතියෝ** | | | |
| ශිෂ්‍යාධාර | 2,428,430 | | 1,696,430 |
| **එකතුව** | **2,428,430** | | **1,696,430** |
| | | | |
| **සටහන - 04** | | | |
| **රජයට දෙන ණය හා අත්තිකාරම්** | | | |
| ආපදා ණය | 17,210,247 | | 17,446,685 |
| කාර්ය මණ්ඩල ණය | 83,640 | | 118,490 |
| වාහන ණය | 666,136 | | 610,000 |
| පරිගණක ණය | 522,000 | | 903,089 |
| විදේශ ආපදා ණය (මාස දෙකක්) | 16,728 | | 89,987 |
| උත්සව අත්තිකාරම් | 40,000 | | - |
| **එකතුව** | **18,538,751** | | **19,168,250** |
| | | | |
| **සටහන - 05** | | | |
| **ගබඩා අත්තිකාරම්** | | | |
| ගබඩා අත්තිකාරම් ගිණුම (භාණ්ඩ ලැයිස්තුව) | 13,300,902 | | 2,372,060 |
| **එකතුව** | **13,300,902** | | **2,372,060** |
| | | | |
| *අවසාන භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල තීරණය මෙතෙක් ලබා ගෙන නොමැති බැවින් 2021.12.31 වැනි දිනට ගබඩා අත්තිකාරමේ ඇතුළත් කර තිබූ රු. 49,034.98ක බඩු තොගය බැහැර කළ යුතු ඒවා ලෙස හඳුනා ගෙන නොමැත.* | | | |
| **සටහන - 06** | | | |
| **පූර්ව-ගෙවීම්** | | | |
| වසර අවසානයේ දී | 102,110 | | 1,422,010 |
| **එකතුව** | **102,110** | | **1,422,010** |
| | | | |
| **සටහන - 07** | | | |
| **වෙනත්** | | | |
| තැන්පතු - ඉන්ධන | 138,500 | | 138,500 |
| ආහාර | 3,000 | | 3,000 |
| විදුලිය | 511,395 | | 511,395 |
| ගෑස් සිලින්ඩර | 43,768 | | 43,768 |
| ජලය | 276,000 | | 276,000 |
| ඩයලොග් රූපවාහිනිය | 18,000 | | 18,000 |
| සේවකයින් සඳහා වූ ඩයලොග් පැකේජය | 1,725 | | 49,335 |
| ලැබිය යුතු ආපනශාලා ගාස්තු | 1,500 | | 500 |
| ආයෝජනවලින් ලැබිය යුතු පොලිය | 998,916 | | 1,166,485 |
| නේවාසිකාගාර ගාස්තු ලෙද ලැබිය යුතු දේ | 70,520 | | |
| වැටුප් අත්තිකාරම් | 176,000 | | |
| 2021/2022 යෝග පිළිබඳ ඩිප්ලෝමාවෙන් ලැබිය යුතු දේ | 18,649 | | |
| 2021 නක්ෂත්‍රය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවෙන් ලැබිය යුතු දේ | 10,649 | | - |
| ආයුර්වේදය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවෙන් ලැබිය යුතු | 14,649 | | - |
| විවිධ තැන්පතු (සිම් කාඩ්පත සඳහා) | 14,000 | | - |
| | **2,297,269** | | **2,206,983** |

12

## සටහන - 08 - දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය/ ගණනය කිරීම

***සින්නක්කර වත්කම්*** රු.

| විස්තරය | ඉඩම | ගොඩනැගිලි | කාර්යාල උපකරණ | විද්‍යාගාර හා තාක්ෂණ උපකරණ | ගෘහභාණ්ඩ හා සවිකිරීම් | පුස්තකාල පොත් හා වාරසඟරා | මෝටර් රථ | පිරියත හා යන්ත්‍රසූත්‍ර | ලෝගු | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2021.01.01 දිනට ශේෂය | 236,000,000 | 266,806,300 | 85,952,436 | 55,906,119 | 35,592,467 | 15,825,406 | 26,922,217 | 23,606,343 | - | 746,611,288 |
| | | | | | | | | | | |
| **එකතුව* 1** | - | 68,838,175 | 13,553,120 | 1,822,760 | 10,667,551 | 8,580 | 1,675,025 | 2,324,424 | 599,000 | 99,488,634 |
| ගැලපීම් | - | - | (59,068,365) | (55,906,119) | (35,592,467) | - | - | - | - | (150,566,951) |
| ප්‍රත්‍යාගණන | | | 25,325,500 | 7,366,500 | 3,430,100 | | | | | 36,122,100 |
| | | | | | | | | | | |
| **2021.12.31 දිනට ශේෂය** | **236,000,000** | **335,644,474** | **65,762,691** | **9,189,260** | **14,097,651** | **15,833,986** | **28,597,242** | **25,930,767** | **599,000** | **731,655,071** |
| **සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | | | | |
| **විස්තරය** | **ඉඩම්** | **ගොඩනැගිලි** | **කාර්යාල උපකරණ** | **විද්‍යාගාර හා තාක්ෂණ උපකරණ** | **ගෘහභාණ්ඩ හා තිරවුරු** | **පුස්තකාල පොත් හා වාරසඟරා** | **මෝටර් රථ** | **පිරියත හා යන්ත්‍රසූත්‍ර** | | **එකතුව** |
| 2021.01.01 දිනට ශේෂය | - | 30,059,402 | 45,792,351 | 52,579,413 | 25,687,271 | 15,771,853 | 9,576,908 | 14,611,052 | | 194,078,251 |
| වර්ෂය සඳහා අය කළ | | 14,897,589 | 10,699,416 | 1,473,300 | 575,343 | 334,603 | 5,641,743 | 1,907,649 | 107,660 | 35,637,302 |
| ගැලපීම් | | | | | | (1,202,492) | | | | (1,202,492) |
| ප්‍රත්‍යාගණනය සඳහා ඉවත් කිරීම | - | - | (45,792,351) | (52,579,413) | (25,687,271) | | | | | (124,059,036) |
| **2021.12.31 දිනට ශේෂය** | - | 44,956,990 | 10,699,416 | 1,473,300 | 575,343 | 14,903,965 | 15,218,651 | 16,518,701 | 107,660 | 104,454,025 |
| | | | | | | | | | | |
| 2020.12.31 දිනට ශේෂය ධාරක ශේෂය | 236,000,000 | 236,746,898 | 40,160,085 | 3,326,706 | 9,905,196 | 53,553 | 17,345,309 | 8,995,292 | | 552,533,038 |
| 2021.12.31 දිනට ශේෂය ධාරක ශේෂය | **236,000,000** | **290,687,484** | **55,063,275** | **7,715,960** | **13,522,308** | **930,021** | **13,378,591** | **9,412,067** | **491,340** | **627,201,046** |

**සටහන්**

1. (නව පරිපාලන ගොඩනැගිල්ල, අත්කර ගැනීමේ ක්‍රියාවලිය යටතේ ඉඩම් හැරුණු කොට) ඉඩම්, ගොඩනැගිලි සහ මෝටර් රථ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ප්‍රත්‍යාගණනය කරනු ලැබූ අතර 2020 වර්ෂය තුළ දී අවශ්‍ය ගැලපීම් සිදු කරන ලදී. 2020 මූල්‍ය වර්ෂය අවසානය වන විට කාර්යාල උපකරණ, විද්‍යාගාර හා ශික්ෂණ උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම්වලට අදාළ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට තක්සේරු කමිටු පත් කරන ලද අතර ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය නිමා කරන ලදී. 2021.01.01 දින වන විට නව වටිනාකම් හඳුනා ගෙන, වාර්තා කරන ලද අතර ඒ අනුව ක්‍රමක්ෂය කරන ලදී.
2. උසස් අධ්‍යාපනය වේගවත් කිරීම සහ සංවර්ධනය (AHEAD) ව්‍යාපෘතිය අතිරේක ශිෂ්‍ය බඳවා ගැනීම සඳහා 2021 දෙසැම්බර් මස ලැබූ රු. 21,452,624ක මුදලක් කාර්යාල උපකරණ, කාර්යාල ගෘහභාණ්ඩ, විද්‍යාගාර හා ශික්ෂණ උපකරණ මිල දී ගැනීමට සම්පූර්ණයෙන්ම උපයෝජනය කර ගෙන ඇති අතර දේපළ, පිරියත හා උපකරණ යටතේ ඇතුළත් කර ඇත.
3. 2021.12.09 දින පැවති පුස්තකාල කමිටු රැස්වීමේ දී රු. 317,137.50ක් වටිනාකම ඇති පුස්තකාල පොත් තොගයක් (513) උපයෝජනය කර නොමැති බවට සහ කල්පැන ඇති බවට හඳුනා ගෙන ඇත. 2022 පෙබරවාරි මස 03 වැනි දින පැවති මුදල් කමිටුවේ 6වැනි රැස්වීමේ දී මෙම කරුණ සම්බන්ධයෙන් සමාලෝචනය කර නිර්දේශ ලබා දීම පිණිස ස්වාධීන කමිටුවක් පත් කරන ලදී. කෙසේවුව ද, වාර්තාකරණ දිනය වන තෙක් මෙය විසඳා නොමැතිව පැවති අතර මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුනි.
4. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් 2020 සැප්තැම්බර් මාසයේ දී වාහනයක් (WP-KL-6080) ලැබුනු අතර එම වාහනය සඳහා තක්සේරු කිරීමක් ලබා ගන්නා ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් ලැබී ඇත. කෙසේවුව ද, 2022 පෙබරවාරි 24 වැනි දින රු. මිලියන 10ක් සඳහා තක්සේරු වාර්තාවක් ලැබී ඇත. 2022 වසරේ සිට නව වටිනාකම වාර්තා කිරීමට පියවර ගනු ඇත.

13

| | 2021 | 2020 |
|---|---|---|
| | රු. | රු. |
| **සටහන - 09** | | |
| **<u>කෙරී ගෙන යන වැඩ</u>** | | |
| අධ්‍යයන ගොඩනැගිල්ල | 78,230,870 | 46,063,209 |
| කාන්තා නේවාසිකාගාරය | - | 572,000 |
| **එකතුව** | **<u>78,230,870</u>** | **<u>46,635,209</u>** |
| | | |
| **සටහන -10** | | |
| **<u>අස්පර්ෂණීය වත්කම්</u>** | | |
| ආරම්භයේ දී ශේෂය | 243,323 | 761,800 |
| වසර තුළ දී එකතු කිරීම් | - | - |
| | (86,040) | (518,477) |
| **එකතුව** | **<u>157,284</u>** | **<u>243,323</u>** |
| | | |
| **සටහන -11** | | |
| **<u>සමුච්ඡිත වියදම්</u>** | | |
| විදුලි බලය | 125,000 | 315,000 |
| ජලය | 125,000 | 321,000 |
| දුරකථන | 810,500 | 1,084,000 |
| වෙනත් පුනරාවර්තන | 202,000 | 45,800 |
| බාහිර කථිකාචාර්ය ගාස්තු | - | - |
| ඉන්ධන | 155,000 | 146,000 |
| ගමන් | - | 9,000 |
| ප්‍රවාහනය | 5,000 | - |
| අතිකාල | 268,000 | 168,000 |
| විභාග ගාස්තු | 2,200,000 | 750,000 |
| නඩත්තු වියදම් - වාහන | 485,600 | 150,000 |
| සුරකුම්පත් | 1,934,700 | 1,215,920 |
| පුවත්පත් | 25,000 | 171,000 |
| නඩත්තු පිරියත හා යන්ත්‍රෝපකරණ | 5,000 | - |
| පිරිසිදු කිරීමේ සේවා | 894,000 | 702,250 |
| අනුපාත සහ බදු | 530,000 | 3,000 |
| වැටුප් | 330,000 | 300,000 |
| වෙනත් සේවා | 7,000 | 213,000 |
| මුද්‍රණ ගාස්තු | - | - |
| වෙනත් සැපයුම් | - | - |
| නිවාඩු ගෙවීම් | - | 7,000 |
| විශේෂ සේවාවන් | 35,000 | 4,500 |
| වාර ප්‍රවේශපත්‍ර | - | - |
| සංග්‍රහ වියදම් | 15,000 | - |
| | 4,000 | - |
| **එකතුව** | **<u>8,155,800</u>** | **<u>5,605,470</u>** |
| **සටහන -12** | | |
| **<u>කළ යුතු ගෙවීම්</u>** | | |
| විවිධ ණයකරුවෝ | 1,972,633 | 978,955 |
| **එකතුව** | **<u>1,972,633</u>** | **<u>978,955</u>** |
| | | |

14

| සටහන -13 | රු. | රු. |
|---|---|---|
| **ආපසු ගෙවිය යුතු තැන්පතු සහ වෙනත්** | **2021** | **2020** |
| **ආපසු ගෙවිය යුතු තැන්පතු** | | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 15,000 | 5,000 |
| විවිධ තැන්පතු | 971,823 | 918,411 |
| නොගෙවූ වවුචර | 72,220 | 65,220 |
| **වෙනත්** | | |
| රඳවා ගැනීම් | 6,682,558 | 10,157,693 |
| යෝග VI ඩිප්ලෝමාව | 267 | 738,833 |
| යෝග VII ඩිප්ලෝමාව | 598,858 | 867,417 |
| යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව XXVII | 52 | 23,000 |
| විද්‍යාපති 2013/2014 | 50,000 | 358,036 |
| විද්‍යාපති 11 කොටස 2013/2014 | 30,000 | 461,052 |
| විද්‍යාපති පංචකර්ම 2013/2014 | 100,000 | 1,713,386 |
| විද්‍යාපති කායචිකිත්සාව 2013/2014 | 100,000 | 1,049,179 |
| පංචකර්ම ඩිප්ලෝමාව - 2015 | 100,000 | 2,997,313 |
| ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමාව -11 | - | 475,319 |
| පංචකර්ම ඩිප්ලෝමාව - 2016/2017 | 1,639,424 | 2,392,424 |
| කායචිකිත්සාව ඩිප්ලෝමාව - 2016/2017 | 100,000 | 2,420,634 |
| කායචිකිත්සාව ඩිප්ලෝමාව - 2015 | 100,000 | 1,093,896 |
| ශල්‍යතන්ත්‍රය ඩිප්ලෝමාව - 2016/2017 | 1,335,064 | 1,749,214 |
| ශල්‍යතන්ත්‍රය ඩිප්ලෝමාව - 03 | 3,047,598 | 1,022,118 |
| යෝග සහතිකපත්‍ර පාඨමාලාව -28 | 51 | 18,055 |
| යෝග සහතිකපත්‍ර පාඨමාලාව -29 | 60 | 26,000 |
| යෝග සහතිකපත්‍ර පාඨමාලාව - 30 | 44,000 | 44,000 |
| කායචිකිත්සාව ඩිප්ලෝමාව - 2017/2018 | 421,057 | 895,447 |
| කායචිකිත්සාව ඩිප්ලෝමාව - 2018/2019 | 1,708,957 | 1,170,750 |
| පංචකර්මය ඩිප්ලෝමාව - 2017/2018 | 1,160,148 | 1,160,148 |
| පංචකර්මය ඩිප්ලෝමාව - 2018/2019 | 1,111,362 | 1,572,725 |
| එම්. ඒ. ඒ. අයි. පිළිබඳ ඩිප්ලෝමාව - 2018/2019 | 3,913,578 | 7,032,156 |
| විද්‍යාපති කායචිකිත්සාව 2017/2018 | - | 3,655 |
| විගණන ගාස්තු සඳහා වෙන් කිරීම | 1,439,156 | 1,049,356 |
| උපයන විට ගෙවීමේ බද්ද | - | - |
| මුද්දර ගාස්තු | 19,250 | 125 |
| පරිපාලන කළමනාකරණය පිළිබඳ විද්‍යාපති | 296,000 | - |
| පරිපාලන කළමනාකරණය පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව 2021/2022 | 108,853 | - |
| යෝග විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 2021/2022 | 84,851 | - |
| යෝග - 2021/2022 (31) | 3,351 | - |
| ආයුර්වේද ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමාව 2021/2022 | 27,351 | - |
| කායචිකිත්සාව පිළිබඳ විද්‍යාපති 2021/2022 | 67,721 | - |
| පංචකර්ම පිළිබඳ විද්‍යාපති 2021/2022 | 29,501 | - |
| ශල්‍යකර්ම පිළිබඳ විද්‍යාපති 2021/2022 | 221,501 | - |
| කායචිකිත්සාව පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව 2021/2022 | 8,041 | - |
| පංචකර්ම පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව 2021/2022 | 2,041 | - |
| ශල්‍යකර්ම පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව 2021/2022 | 59,351 | - |
| | **25,669,049** | **41,480,562** |
| | | |
| **සටහන - 14** | | |
| **විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්** | | |
| ආරම්භයේ දී ශේෂය | 132,403,242 | 145,801,141 |
| වසර සඳහා ගෙවීම | (15,858,210) | (3,819,832) |
| වසර සඳහා ගැලපීම | 5,781,886 | (30,214,196) |
| වසර සඳහා අය කිරීම | 20,309,386 | 20,636,130 |
| **එකතුව** | **142,636,305** | **132,403,242** |
| | | |

15

| | | |
|---|---|---|
| | රු. | රු. |
| **සටහන - 15** | | |
| **<u>සීමා කළ අරමුදල් සහ ප්‍රදාන</u>** | **2021** | **2020** |
| NCAS පර්යේෂණ අරමුදල - වෛද්‍ය ඩබ්ලිව්. ඒ. එල්. චන්ද්‍රසිරි | 111,299 | 111,299 |
| දර්ශනගුරි පර්යේෂණ - ආර්.එස්.සී.ජී.රාජපක්ෂ මිය | - | 1,645,000 |
| ජේ. පී. වික්‍රමාරච්චි පරිසංවාදය | 1,166,551 | 1,178,551 |
| සංවර්ධන ප්‍රථම උපාධි වැඩසටහන | 1,214,142 | 1,214,142 |
| ත්‍රෛභාෂා අරමුදල | 114,450 | 114,450 |
| පියසීලී වික්‍රමාරච්චි ජයසේකර | 591,507 | 582,742 |
| ත්‍යාග හා ප්‍රදාන | 34,286,521 | 40,923,766 |
| ක්‍රීඩා අරමුදල | 314,540 | 314,540 |
| පර්යේෂණ අරමුදල | 3,482,761 | 1,439,234 |
| උපකුලපති අරමුදල | 858,101 | 387,441 |
| එෆ්.ජී.එස්. සංවර්ධන ක්‍රියාකාරකම් | 328,762 | 208,903 |
| වික්‍රමාභිණී වැඩසටහන | 83,640 | 83,640 |
| ස්වර්ණමුද්‍රික වැඩසටහන | 290,000 | 290,000 |
| සංවර්ධන අරමුදල | 10,000 | 10,000 |
| වෛද්‍ය ලීලාරත්න අනුස්මරණ ශිෂ්‍යත්වය | 119,622 | 116,150 |
| ජී.පී. වික්‍රමාරච්චි අනුස්මරණ ශිෂ්‍යත්වය | 77,185 | 73,320 |
| වෛද්‍ය සිසිර වික්‍රමාරච්චි ශිෂ්‍යත්වය | 232,468 | 220,819 |
| F.G.S. අරමුදල | 69,139 | 31,240 |
| සංවර්ධන අරමුදල (ශල්‍යශාලකාය) | 9,000 | 9,000 |
| තොරතුරු තාක්ෂණය සංවර්ධනය | 10,000,000 | |
| ස්වයං-මූල්‍යකරණ ක්‍රියාකාරකම් | 10,752,239 | |
| එකතුව | **<u>64,111,926</u>** | **<u>48,954,236</u>** |

| | | |
|---|---|---|
| **සටහන - 16** | | |
| **<u>ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගනන සංචිතය සහ වෙනත්</u>** | | |
| ස්ථාවර වත්කම් | 196,103,517 | 196,103,517 |
| මෝටර් වාහන ප්‍රත්‍යාගනන සංචිතය | 24,832,651 | 24,832,651 |
| ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීමේ අරමුදල | - | 452,960 |
| ගෘහභාණ්ඩ, උපකරණ ආදිය ප්‍රත්‍යාගණනය | 9,614,184 | |
| | **<u>230,550,352</u>** | **<u>221,389,128</u>** |
| | | |
| **සටහන - 17** | | |
| **<u>විවිධ ලැබීම්</u>** | | |
| විවිධ ආදායම | 8,833,405 | 945,586 |
| ලියාපදිංචි ගාස්තුව (සැපයුම්කරුවන්) | 207,000 | 186,000 |
| | **<u>9,040,405</u>** | **<u>1,131,586</u>** |
| | | |

16

| | රු. | රු. |
|---|---|---|
| | **2021** | **2020** |
| **සටහන - 18** | | |
| **<u>දේපළ කුලිය</u>** | | |
| ආපනශාලාවලින් කුලිය | 6,000 | 10,000 |
| දේපළවලින් කුලිය | 120,845 | 176,257 |
| | **<u>126,845</u>** | **<u>186,257</u>** |
| | | |
| **සටහන - 19** | | |
| **<u>ශිෂ්‍යාධාර සහ මහපොළ</u>** | | |
| ශිෂ්‍යාධාරවලින් ලැබීම් | 9,840,430 | 7,652,430 |
| ශිෂ්‍යාධාර ගෙවීම් | (9,840,430) | (7,652,430) |
| මහපොළින් ලැබීම | | - |
| මහපොළ ගෙවීම්* | | - |
| **ශුද්ධ** | | - |
| | | |

*** සටහන**

මහපොළ භාරකාර අරමුදල මගින් 2021 වර්ෂය තුළ දී මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් එක් එක් ශිෂ්‍යයාගේ බැංකු ගිණුමට සෘජුවම බැර කරන ලදී.

17

<u>**අයවැය හා තථ්‍ය සැසඳීම - 2021**</u>

| | **2021**<br>අයවැය<br>රු. | අතිරේක<br>වෙන්කිරීම්<br>මාරු කිරීම<br>රු. | මුළු<br>සංශෝධිත<br>අයවැය<br>රු. | **2021** තථ්‍ය වියදම්<br><br>රු. |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | | | |
| පුනරාවර්තන ප්‍රදාන | 464,000,000 | 40,000,000 | 504,000,000 | 489,000,000 |
| වෙනත් ප්‍රදාන | | | | |
| | <u>**464,000,000**</u> | <u>**-**</u> | <u>**504,000,000**</u> | <u>**489,000,000**</u> |
| වෙනත් ආදායම | | | | |
| (1) ණය හා අත්තිකාරම්වලින් පොලිය | 810,000 | | | 793,084 |
| (2) විවිධ ලැබීම් | 288,000 | | | 9,040,405 |
| (3) ආයෝජනවලින් පොලිය | 14,860,000 | | | 19,395,484 |
| (4) ලියාපදිංචි ගාස්තු | 725,000 | | | 534,150 |
| (5) විභාග ගාස්තු | 52,000 | | | 69,850 |
| (6) පුස්තකාල දඩ | 40,000 | | | 2,935 |
| (7) වෛද්‍ය ගාස්තු | 110,000 | | | - |
| (8) දේපලවලින් කුලිය | 355,000 | | | 126,845 |
| (9) පැරණි තොග අලෙවිය | - | | | 42,680 |
| (10) පාඨමාලා ආදායම | <u>13,325,000</u> | | | <u>13,283,709</u> |
| **එකතුව** | <u>**30,565,000**</u> | | | <u>**43,289,142**</u> |
| | **494,565,000** | | **504,000,000** | <u>**532,289,142**</u> |
| **මෙහෙයුම් වියදම්** | | | | |
| (1) පුද්ගලික පඩිනඩි | 374,000,000 | | | 383,889,753 |
| (2) ගමන් වියදම් | 635,000 | | | 85,748 |
| (3) සැපයුම් හා භාවිතා කළ පරිභෝජන භාණ්ඩ | 10,285,000 | | | 12,432,029 |
| (4) නඩත්තු | 7,240,000 | | | 6,766,066 |
| (5) කොන්ත්‍රාත් සේවා | 61,570,000 | | | 38,731,230 |
| (6) ක්ෂයවීම | - | | | 35,637,302 |
| (7) උත්පාදිත අරමුදල් වියදම් | - | | | 3,186,369 |
| (8) වෙනත් මෙහෙයුම් වියදම් | 27,000,000 | | | 16,562,968 |
| (9) පාඨමාලා වියදම් | 13,835,000 | | | 13,400,375 |
| **එකතුව** | <u>**494,565,000**</u> | | **504,000,000** | <u>**510,691,840**</u> |
| | | | | |
| **ප්‍රාග්ධන ප්‍රදාන** | **130,000,000** | | | **118,800,000** |
| **ප්‍රාග්ධන වියදම්** | | | | |
| පුනරුත්ථාපන හා ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම | 58,750,000 | | | 68,838,175 |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | 25,825,000 | | | 29,650,460 |
| ඉදිකිරීම් ව්‍යාපෘති - අඛණ්ඩ (වෙනත්) | 39,000,000 | | | 32,167,661 |
| ඉදිකිරීම් ව්‍යාපෘති - නව | - | | | - |
| පර්යේෂණ හා සංවර්ධනය | 3,325,000 | | | - |
| මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය | <u>3,100,000</u> | | | - |
| | **130,000,000** | | | <u>**130,656,296**</u> |
| | <u>**519,443,000**</u> | | | **641,348,136** |

# 23. 2021 තිරසාර සංවර්ධන ඉලක්ක මත පදනම් වූ අනාගත අපේක්ෂාවන් පිළිබඳ වාර්තාව - 2021

## ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

## තිරසාර සංවර්ධනය සඳහා යෝජනා

## ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

2020.07.08 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී "සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ ගම්පහ දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීමට සමගාමීව යක්කල, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක තත්ත්වයට උසස් කිරීම සඳහා තීරණය කරන ලදින් වර්තමාන විද්‍යායතනය 2021.03.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" නමින් විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීම සඳහා වූ එකී නියෝගය 2020.10.28 දිනැති අංක 2199/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයෙන් නිකුත් කරන ලදී.

නව විශ්වවිද්‍යාලයට පීඨ හතරක් සහ අධ්‍යයන අංශ 14ක් ඇතුළත් වන අතර ප්‍රථම උපාධි වැඩසටහන් 11ක් සහ පශ්චාත් උපාධි පාඨමාලා 10ක් පිරිනමනු ලබයි. විශ්වවිද්‍යාලය 2020 වර්ෂයේ උසස් පෙළ ප්‍රතිඵල මත පදනම්ව ප්‍රථම උපාධි මට්ටම සඳහා ශිෂ්‍යයින් 600ක් පමණ ඇතුළත් කරවා ගැනීමට යෝජනා කරන ලද අතර මෙම ශිෂ්‍ය බඳවා ගැනීම ක්‍රමයෙන් වැඩි කරනු ඇත.

විශ්වවිද්‍යාලය දේශීය වෛද්‍ය පීඨය, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය පීඨය, දේශීය සමාජ විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය යන පීඨ හතරකින් සැදුම්ලත් වේ. මෙම පීඨවලට අධ්‍යයන අංශ 14ක් ඇතුළත් වේ. විශ්වවිද්‍යාලය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (BAMS) හැරුණු කොට 2021 වර්ෂයේ දී නව ප්‍රථම උපාධි පාඨමාලා හතක් ආරම්භ කිරීමටත් පසුව ක්‍රමයෙන් ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටම්වලට නව පාඨමාලා හඳුන්වා දීමට අපේක්ෂා කරයි.

විශ්වවිද්‍යාලය පහත සඳහන් කර ඇති පරිදි තිරසාර පරමාර්ථවලට අනුකූලව 2021-2025 දක්වා කාලය සඳහා ඉලක්ක 06ක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, මෙම විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සැලසුම ද සකස් කර ඇත.

01 වැනි ඉලක්කය - දේශීය වෛද්‍ය අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීම

02 වැනි ඉලක්කය - දේශීය වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හරහා ඒ පිළිබඳ රාජ්‍ය උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ඉහළ නැංවීම

03 වැනි ඉලක්කය - දේශීය වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මක පර්යේෂණ සහ නවෝත්පාදනය හරහා ශාස්ත්‍රීය විශිෂ්ටත්වය වැඩිදියුණු කිරීම

04 වැනි ඉලක්කය - ඉහළ ගුණාත්මක, කාර්යක්ෂම මානව ප්‍රාග්ධනය සමඟ විශ්වවිද්‍යාලය වැඩිදියුණු කිරීම

05 වැනි ඉලක්කය - ශක්තිජනක නිපුණතා උපාධිධාරියෙකු බිහි කිරීම

06 වැනි ඉලක්කය - කාර්යක්ෂම සහ ඵලදායී කළමනාකරණ සංස්කෘතියක් අත්කර ගැනීම පිණිස ආරක්ෂිත සහ ස්ථාවර පද්ධති හරහා විශ්වවිද්‍යාලයේ පාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම

1. 2021 වර්ෂයේ දී විශ්වවිද්‍යාලය තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම පිනිස පහත දැක්වෙන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත.

    i. විශ්වවිද්‍යාලයේ දෛනික කාර්යභාරයන් ඉටු කිරීමේ දී ආයතනික දායකත්වය ඉහළ නැංවීමේ ඉලක්කය ඇතිව මානව සම්පත බඳවා ගැනීමේ දී සහ පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ දී ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සඳහා වැඩි අවධානයක් යොමු කොට ඇත.

    ii. විශ්වවිද්‍යාලයේ කාන්තා කාර්ය මණ්ඩල සාමාජිකාවන්ගේ ආරක්ෂාව සඳහා හිතකර වැඩ පරිසරයක් සැලසීම පිණිස ප.ව. 6.00න් පසු වැඩ කරන කාලය අඩු කිරීමට පියවර ගෙන ඇති අතර හදිසි අවස්ථා අවශ්‍යතාවන්හි දී කාන්තා කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ

ගමනාන්තවලට ප්‍රවාහන පහසුකම් ලබාදීමට පියවර ගෙන ඇති අතර මෙම කාර්ය සඳහා හැකිතාක් දුරට කාන්තා අධීක්ෂණ නිලධාරීන්ගේ සහාය ලබා ගැනීමට පියවර ගෙන ඇත.

iii. ඒ අතර, කාන්තා නිලධාරීන් අතර සමාන ප්‍රමාණයේ වැඩ බෙදාහැරීම මඟින් කාර්යක්ෂම වැඩ ධාරිතාවන්ට දායක වන වැඩ පරිසරයක් නිර්මාණය කර ඇත.

2. ස්ත්‍රී-පුරුෂ, වාර්ගික, ආගමික හෝ කුල වෙනස්කම් නොමැතිව පිරිමි සහ කාන්තා ශිෂ්‍යයින්ට තිරසාර සංවර්ධන ඉලක්ක යටතේ උසස් අධ්‍යාපනයේ ඵල නෙළා ගැනීමට සහ සමාන ඉඩප්‍රස්ථා සැලසීමට පියවර ගෙන ඇත.

3. පරිසරයට කසළ මුදා හැරීමෙන් සිදු වන අහිතකර ඵලවිපාක අවම කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ කසළ එක්රැස් කොට කාබනික පොහොර සකස් කිරීමේ වැඩසටහනක් දැනටමත් ක්‍රියාත්මක වන අතර එකී කාබනික පොහොර විශ්වවිද්‍යාලයේ වගාවන්වලට යොදා ගැනීමට සහ විශ්වවිද්‍යාලය තුළ පරිසර හිතකාමී පරිසරයක් නිර්මාණය කර ගැනීමට විශාල දායකත්වයක් දක්වා ඇත.

4. "ඉගෙනුම අතර වැඩ කිරීම" (Work while Learning) සංකල්පය ක්‍රියාත්මක කිරීම. අපගේ ශිෂ්‍යයින්ට රජයේ සහ පෞද්ගලික ආයතනවලින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට උපකාර වනු පිණිස විශ්වවිද්‍යාලය මඟින් එම ආයතන සමඟ සාකච්ඡා කර ඇත.

5. රැකියාගත කිරීමට සුදුසුකම් සපුරාලන උපාධිධාරීන් බිහි කිරීම. 21වැනි සියවසයේ කුසලතා, කළමනාකරණ නිපුණතා, මානව සම්පත් කුසලතා ආදිය පිළිබඳ දැනුම ප්‍රධාන විෂයමාලාව හරහා ලබා ගැනීම පිණිස සියලුම උපාධි අපේක්ෂකයින්ට පාඨමාලා මොඩියුල හඳුන්වාදීමට තීරණය කර ඇත.

6. "විකුම් උයන" ඇවිදීමේ මංතීරු ව්‍යාපෘතිය 2021 මැයි මස 28 වැනි දින ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියට ඔසු උයනක්, ගිමන් ප්‍රදේශයක් සහ වාහන ධාවන කළ හැකි අලෙවි ප්‍රදේශයක් ඇතුළත් වේ. විශ්වවිද්‍යාලය මෙම ව්‍යාපෘතිය සාමාජීය ව්‍යාපෘතියක් ලෙස කළමනාකරණය කිරීමට අපේක්ෂා කරයි.

7. දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ කාර්ය මණ්ඩලය පරිසරය සහ ජෛවවිවිධත්වය ආරක්ෂා කිරීම සහ පාංශු ඛාදනය වළක්වා ගැනීම සම්බන්ධයෙන් විශාල දායකත්වයක් දක්වා ඇත.

i. දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂක ශිෂ්‍යයින්ගේ අධ්‍යාපනික කාර්යයන් සඳහා අවශ්‍ය ඔසු පැළ වගා කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් වතුපිටිවල පිහිටි අක්කර 6ක පමණ ඉඩමේ ඔසු උයනක් පවත්වා ගෙන යනු ලැබේ. ද්‍රව්‍යගුණ විඥාණ අධ්‍යයන අංශය යටතේ ඖෂධ පැළ වගා කිරීමේ පාඨමාලාව හදාරන ශිෂ්‍යයින් විසින් ඔසු පැළ වගා කොට රජයේ ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට කටයුතු කොට ඇත.

ii. පීඨ පරිශ්‍රයේ ඇති වෘක්ශලතාවලින් වැටෙන කොළ අතු එක්රැස් කර කොම්පෝස්ට් සකස් කිරීමේ ක්‍රියාවලිය. එසේ සකස් කරන කොම්පෝස්ට් පොහොරක් ලෙස විශ්වවිද්‍යාලයේ වගා කොට ඇති ඖෂධ පැලෑටිවලට සහ වතුපිටිවල ඔසු උයනේ ශාකවලට යෙදීමට පියවර ගෙන ඇත.

8. දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට පහත දැක්වෙන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත.

i. ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සඳහා වූ මධ්‍යස්ථානය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවයමය ප්‍රචණ්ඩත්වය සහ නවක වදය වැළැක්වීම මඟින් මැදිහත් වන ක්‍රියාකාරකම්වලට පීඨයේ සක්‍රීය මැදිහත්වීම සහ අවධානය යොමු කිරීම.

ii. කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ හැසිරීම්, කණ්ඩායම් වැඩ, සහ හැඟීම, ත්‍යාග ප්‍රදානය කිරීම සහ අභිප්‍රේරණය ආදිය ඇතුළත් කර ගනිමින් සියලුම අභ්‍යන්තර පාර්ශ්වයන් අතර නිදහස් ද්විපාර්ශ්වික සන්නිවේදනය, සාමාන්‍ය සබඳතා ඇති අභ්‍යන්තර ආයතනික සංස්කෘතියක් පෝෂණය කිරීම

iii. තිරසාරකත්වය පිළිබඳ ආයතනික උද්දේශනය සහ උපදේශනය. කෘෂිකර්මය සහ තාක්ෂණය පිළිබඳ දේශගුණික බුද්ධිමත් මූලාරම්භයන් සඳහා දේශගුණික නායකයින් ලෙස යොවුන් සේනාංක තරුණයින් පුහුණු කිරීමට යෝජනාවක් ගොඩනඟන ලදී - ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යාංශය

9. දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට පහත දැක්වෙන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත.

   i. ශිෂ්‍යයින් සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම පිණිස, වේගයෙන් වෙනස්වන සමාජයේ, ජාතියේ සහ ලෝකයේ ඉල්ලීම් සපුරාලීම පිණිස, නව උපාධි වැඩසටහන් සමාලෝචනය කිරීම, උත්ශ්‍රේණිගත කිරීම මෙන්ම නිර්මාණය කිරීම සඳහා පීඨය කැපවී සිටී. අපි අධ්‍යාපනය යන්න විෂයමාලාවේ සිට අත්‍යවශ්‍ය වෘත්තීය සහ ජීවන කුසලතා දක්වා විහිදෙන ශිෂ්‍ය කේන්ද්‍රීය සාකල්‍ය අධ්‍යාපනයක් දක්වා කටයුතු කරන්නෙමු. අපි ‘අනාගත පරපුර සඳහා ගුණාත්මක අධ්‍යාපනයක’ අවශ්‍යතාව සපුරාලීම පිණිස මෛත්‍රීය, සහයෝගය, අවංකභාවය සහ සහභාගීත්වය වැනි සාරධර්ම ඉහළින් අගයන සහ ප්‍රවර්ධනය කරන ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය සඳහා ධනාත්මක වැඩ සංස්කෘතියක් පීඨය තුළ ඇති කිරීමට අපේක්ෂා කරමු.

   ii. අවසාන සාරධර්මය අනුව අපි තිරසාර සංවර්ධන ඉලක්කවලට (10) අනුකූලව අසමානතා අවම කළ තත්ත්වයක් තුළ සහභාගීකර ගැනීමේ පරිසරයක් නිර්මාණය කර ගැනීම කෙරෙහි කැපවී සිටිමු. පීඨය ශ්‍රී ලාංකික ප්‍රජාව නියෝජනය කරන විවිධාකාර ප්‍රජාවකි. ඒ අනුව අපි වාර්ගිකත්වය, ස්ත්‍රී-පුරුෂභාවය හෝ භෞතික සීමා නිර්ණය කිරීම් නොසලකා සෑම පුද්ගලයෙක්ම කණ්ඩායමක් ලෙස වැඩ කිරීමට පිළිගනු ලබන සහ ආරාධනා කරනු ලබන සහයෝගී සහ විවෘත පරිසරයක් සහතික කර ඇත. අපි ශිෂ්‍යයින්ගේ සුභසිද්ධිය සුරක්ෂිත කිරීම පිණිස සහාය ක්‍රමයක් සහ පීඨය තුළ සහාය ක්‍රමයක් ඇති කිරීමට කැපවී සිටිමු. එසේ කිරීමේ දී අපි කාර්ය මණ්ඩලයට ශිෂ්‍යයින්ට ප්‍රවේශ විය හැකි බවට සහතික කරන අතර ශිෂ්‍යයින්ට සිය ශාස්ත්‍රීය සහ අධ්‍යාපනික නොවන කරුණු සම්බන්ධයෙන් අඛණ්ඩ උපදෙස් සහ මඟපෙන්වීම ලැබිය හැකි උපදේශන වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම අපි සිංහල සහ දෙමළ භාෂාවන් කථා කරන ශිෂ්‍යයින් අතර අසමානතාවන් අවම කිරීම පිණිස ඉංග්‍රීසි භාෂාව ප්‍රවර්ධනය සඳහා ද විශේෂයෙන් අවධාරණය කරමු.

   iii. දේශගුණික ක්‍රියාකාරකම්, තිරසාරකත්වය සහ පරිසරය පිළිබඳ පොදු විඥානය සහ භාවිතයන් ඉහළ නැංවීම පිණිස. මෙහි කොටසක් ලෙස අපි නෙදර්ලන්ත රාජධානියේ තානාපති කාර්යාලයෙන් ඉදිරිපත් කර ඇති තිරසාර ජංගම දුරකථන අංකය සඳහා වූ යෝජනාව ආරම්භ කර ඇත. අපි පීඨය තුළ පා පැදි පැදවීමේ සංස්කෘතියක් ආරම්භ කිරීමට යෝජනා කළ අතර තරඟයේ දී තෙවැනි ස්ථානය දිනා ගැනීමෙන් අනතුරුව තානාපති කාර්යාලය හරහා උපදේශන සේවා ලබා, මෙම යෝජනාවේ විශේෂයෙන් දක්වා ඇති වටිනාකම් සුරැකීමට උත්සාහ කරන්නෙමු.

   iv. පීඨය ලෝක පරිසර දිනය සමරනු වස් වාර්ෂික පෝස්ටර තරඟය සහ රුක් රෝපණ ව්‍යාපාරයක් වැනි අඛණ්ඩ වැඩසටහන් දියත් කිරීමට කැපවී සිටින අතර එවැනි ක්‍රියාදාම හරහා ශිෂ්‍යයින්ට පරිසරය ආරක්ෂා කිරීමේ සහ එහි තිරසාරකත්වය සුරැකීමේ වැදගත්කම අවබෝධ කර ගැනීමට හැකි වේ.

10. ඉදිරි වර්ෂයේ තීරණ සහ ඉලක්ක හඳුනා ගැනීම පිණිස සෑම වර්ෂයක් අවසානයේ දීම මෙම ක්‍රියාකාරකම්වල ප්‍රගතිය මැනීමට තොරතුරු ලබා ගනී. ඒ අතරම, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලයේ ප්‍රතිලාභය පිණිස හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ වඩාත් හරිත පරිසරයක් පවත්වා ගැනීමේ ඉලක්කය ඇතිව විශ්වවිද්‍යාලයේ ඉහළ කළමනාකාරීත්යේ උපදේස පරිදි, 2021 වර්ෂය තුළ දී සෑම පියවරක්ම ගැනීමට හැකිවීම සතුටට කරුණකි.

# 24. විගණකාධිපති වාර්තාව – 2021






ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/E/GWUIM/01/21/07 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 මැයි 31 දින

උපකුලපති
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන නිකුත් නොකර ගබඩාවේ පවතින පිරිවැය රු.8,510,955 ක් වූ ප්‍රාග්ධන භාණ්ඩ වර්ග 15 කට අදාළ අයිතම 379 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 7 හි 14 ඡේදය ප්‍රකාරව දේපල, පිරියත හා උපකරණ ලෙස හඳුනාගත යුතු වුවද, ඒ වෙනුවට ජංගම වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ දැක්වෙන ජංගම වත්කම්වල පිරිවැය හා ජංගම නොවන වත්කම්වල පිරිවැය ඊට සමාන අගයකින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දැක්වේ.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලයට ලැබී තිබුණු රු.118,800,000 ක ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම හා මැනීම සිදුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී මෝටර්රථයක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් වැයකර තිබුණු රු.1,150,500 ක් ප්‍රාග්ධනිත කර තිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ පිරිවැය ඊට සමාන අගයකින් හා වර්ෂයට අදාළ මෝටර් රථ ක්ෂය රු.247,752 කින් වැඩියෙන් දැක්වේ. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ද රු.902,748 කින් වැඩියෙන් දැක්වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් විශ්වවිද්‍යාලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

4

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (ආ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/ විධානයට යොමුව | නිරීක්ෂණය |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 570(ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ දෙක ඉක්මවූ එකතුව රු.1,240,057 ක රඳවා ගත් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3 වෙනත් කරුණු**

(අ) 2021 මාර්තු 01 දින සිට විශ්වවිද්‍යාල තත්ත්වයට පත් කර තිබුණු ආයතනය තුළ පීඨ 03 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විට පෙර පැවති දේශීය වෛද්‍ය විද්‍යාපීඨය පමණක් ක්‍රියාත්මකව පැවතුණි. නව පීඨ දෙක ආරම්භ කර නොතිබුණද එම පීඨ සඳහා අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා 48 දෙනෙකු 2021 අගෝස්තු මාසය වන විට බඳවා ගෙන තිබුණු අතර එදින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වැටුප් හා දීමනා ලෙස එකතුව රු.41,423,070 ක් ගෙවා තිබුණි.

(ආ) 2021 පෙබරවාරි 16 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මාර්ගගත ඉගැන්වීම්, ඉගෙනුම් හා ඇගයීම සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සපයා ගැනීම වෙනුවෙන් ලබාදී තිබුණු රු.10,000,000 ක් 2021 දෙසැම්බර් 31 දින වන විට අදාළ අරමුණ වෙනුවෙන් උපයෝජනය නොකර ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි.

(ඇ) අරමුදල් 14 ක පැවති එකතුව රු.6,457,008 ක් සමාලෝචිත වර්ෂය තුළ අදාළ අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ඇ) සිව්මහල් අධ්‍යයන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු රු.මිලියන 134.5 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට 2014 සැප්තැම්බර් 18 දින ප්‍රදානය කර තිබුණු නමුත් ඇති වූ ආරවුලක් මත 2019 ජූලි 03 වන දින කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණු අතර එදින වන විට වැය කර තිබුණු මුදල රු.මිලියන 114.15 ක් විය. ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් කටයුතු II අදියර ලෙස 2020 දෙසැම්බර් 24 දින නැවත ආරම්භ කර තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ නිම කිරීමට අපොහොසත්වී තිබුණු අතර මෙම ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් උපදේශක සේවා සපයන ආයතනයට ද රු.4,247,209 ක් ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

7

## 25. 2021 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවට පිළිතුරු 2021






ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
Gampaha Wickramarachchi University of Indigenous Medicine
கம்பஹா விக்ரமாராச்சி சுதேச மருத்துவப் பல்கலைக்கழகம்

GWUIM/IA/AG/2022

2022.09.14

විගණකාධිපති,

ජාතික විගණන කාර්යාලය,

306/72, පොල් දූව පාර,

බත්තරමුල්ල.

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන්**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක එච්ඊඩී/ඊ/ජීඩබ්යුඅයිඑම්/01/21/07 දරණ 2022.05.31 දිනැති 2021 වර්ෂයේ විගණකාධිපති වාර්තාව හා බැඳේ.

එම වාර්තාවේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය දරණ අදහස් සහ වර්තමාන තත්ත්වය මේ සමග ඉදිරිපත් කරමි.

තවද, මෙහි ඇතුළත් කරුණු 2022 අගෝස්තු 15 දින පැවති විශ්වවිද්‍යාලයේ 05 වන විගණන කමිටු රැස්වීමේදී සාකච්ඡා කර නිර්දේශ කිරීමෙන් අනතරුව 2022 සැප්තැම්බර් 07 දින පැවති විශ්වවිද්‍යාලයේ 17 වන පාලක සභා රැස්වීමේදී අනුමත කර ඇත.

මහාචාර්ය රංජන ඩබ්ලිව් සෙනෙවිරත්න
උපකුලපති

පිටපත් : 1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

උපකුලපති: Vice Chancellor: 0332215771 0332222739
ලේඛකාධිකාරී: Registrar: 0332215772
මූල්‍යාධිකාරී: Bursar: 0332223785
සාමාන්‍ය: Genaral: 0332222748

**<u>ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ කරුණු පැහැදිලි කිරීම්</u>**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ඉහත ගබඩා තොග අත්තිකාරම් ගිණුමේ ඇති භාණ්ඩ බහුතරයක් AHEAD ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ මිල දී ගෙන 2021 දෙසැම්බර් 30 හා 31 දින වල්දී ගබඩාවට ලැබුණු භාණ්ඩ/ උපකරණ වන අතර ඒවා අදාළ අංශ වෙත නිකුත් කරන තෙක් තාවකාලිකව (කෙටි කාලයකට) ගබඩා අත්තිකාරම් යටතේ වර්ග කර දක්වන ලදී. 2021.12.31 දින වන විටත් මෙම භාණ්ඩ උපකරණ අදාළ දෙපාර්තමේන්තු/ඒකක වෙත නිකුත් කර නොමැති බැවින් සහ භාවිතයට ද ගෙන නොමැති බැවින්, ස්ථාවර වත්කම් ලෙස වර්ග කළ නොහැකි බව පෙන්වා දෙමි.
අවසන් ගිණුම් ප්‍රකාශ සමඟ ඉදිරිපත් කරන ලද සටහන් අංක 05 යටතේ ගබඩා අත්තිකාරම් (Stores Advances) ලෙස මෙම ශේෂය දක්වා ඇත්තේ මෙම හේතුව නිසා බව ද දක්වමි. කෙසේ වුවද, මේ වන විට එම සියලු භාණ්ඩ ගබඩා අත්තිකාරම් ගිණුමෙන් නිකුත් කර අදාළ ප්‍රාග්ධන වැය ශිර්ෂය යටතේ ගිණුම් ගත කර ඇත.
කෙසේ වුවද, ඉදිරියේදී අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී ගබඩා අත්තිකාරම් ගිණුමට ගැනෙන මෙවැනි ස්වරූපයේ භාණ්ඩ පිළිබඳ මූල්‍ය ප්‍රකාශ තුළ හෙළිදරවු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) විශ්වවිද්‍යාලයට 2021 වර්ෂයේදී ප්‍රාග්ධන ආධාර ලෙස ලැබූ රු.118,000,000/- ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රාග්ධන ලැබීම් ලෙස වැය නොකළ ප්‍රාග්ධන ගිණුමට ගිණුම් ගත කර ඇත. ප්‍රාග්ධන ස්කන්ධ ප්‍රකාශනය යටතේ වැය නොකළ ප්‍රාග්ධන ගිණුමේ ශේෂයේ ප්‍රතිඵලය නිවැරදිව සටහන් කර ඇති අතර, ඉදිරියේදී ලැබීම් හා ගෙවීම් වෙන් වෙන්ව සටහන් කිරීමට අපේක්ෂා කරමි.

(ඇ) මෙම වියදමින් රු.1,043,517.78 ක් වියදම් දරා ඇත්තේ පරිත්‍යාග ලෙස විශ්වවිද්‍යාලයට ලද මෝටර් රථයක් සඳහා වන අතර, එම රථය භාවිතයට ගැනීමට පෙර වැඩිදියුණු කිරීම් සඳහා දරා ඇති වියදම් ප්‍රාග්ධනිත වර්ගයේ වියදම් වන බැවින් එම වියදම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර ඇත. තවද, අළුත්වැඩියා වියදම් ලෙස ප්‍රාග්ධනිත කරන ලද රු.106,982/- ක මුදලක් වැය කරන ලද්දේ KF-7918 දරණ රථයේ වායු සමීකරණ පද්ධතිය සම්පූර්ණයෙන් අළුත්වැඩියා කර නව වායු සමීකරණ පද්ධතියක් සවි කිරීම වෙනුවෙනි. ඒ අනුව ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 23 ප්‍රකාරව මෙම වැය වූ මුදල ප්‍රාග්ධනිත කර ඇති බව පෙන්වා දෙමි.

1

2. <u>වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u>

2.2.2 **<u>නීතිරීති/ විධානයට යොමුව</u>**

**නොගෙවූ වුචර් තැන්පතු ශේෂ** මුදලින් 2018 - 2020 දක්වා වූ වසර 02 ක පමණ ආසන්න වටිනාකම වන රු.65,220/- ක මුදල ජ.නල් අංක 2022/48 මගින් ආදායමට ගැනීමට කටයුතු කර ඇත.

**විවිධ තැන්පතු ශේෂ** වටිනාකමින් රු.101,500/- ක මුදලක් මේ වන විට නිදහස් කර ඇති අතර, විවිධ තැන්පත් හා ගෙවිය යුතු තැන්පත් වල ඉතිරි ශේෂයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට අදාළ පාර්ශවයන් දැනුවත් කර ඇති අතර, එම තොරතුරු ලද පසු ඉතිරි ශේෂ නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට 2022 වර්ෂයේදී කටයුතු කරනු ලැබේ.

**රඳවා ගත් ශේෂ** වටිනාකමින් රු. 350,156/- මුදලක් මේ වන විට නිදහස් කර ඇති අතර, ඉතිරි ශේෂයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට අදාළ පාර්ශවයන් දැනුවත් කර ඇති අතර, එම තොරතුරු ලද පසු ඉතිරි ශේෂ නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට 2022 වර්ෂයේදී කටයුතු කරනු ලැබේ.

2.3 <u>වෙනත් කරුණු</u>

(අ) 2199/12 ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිතව 2021 මාර්තු මස 01 දින ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යායතනය ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ලෙස උසස් කරන අවස්ථාවේදී විශ්වවිද්‍යාලය සඳහා නව පීඨ තුනක් ඇතුළුව පීඨ 4 ක් ස්ථාපිත විය. ඒ අනුව දේශීය වෛද්‍ය විද්‍යා පීඨය (එතෙක් පැවති) , දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය, දේශීය සමාජීය විද්‍යා සහ කළමනාකරණ පීඨය, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය යන පීඨ හතර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද අධ්‍යයන හා අනධ්‍යයන පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍යය කටයුතු සම්පාදනය කෙරිණි. ඒ අනුව අනධ්‍යයන කාර්යමණ්ඩල සේවක සේවිකාවන් 2021.03.15 දින බඳවා ගැනීම් සිදුකළ අතර අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අනුමත ක්‍රමවේදයන්ට අනුව කටයුතු කර 2021.08.02 දින සහ 2021.08.16 දින වන විට බඳවා ගැනීම් සම්පූර්ණ කර ඇත.

ඒ වන විට විද්‍යායතනයේ ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචිව සිටි ළමුන් 542 දෙනෙකු 2209/75 ගැසට් පත්‍රය මගින් මෙම විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කරන ලද අතර ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු ඉදිරියට සිදුකරගෙන යන ලදී. අලුතින් ආරම්භ කරන ලද පීඨ දෙක සඳහා 2021 අ.පො.ස.(උ. පෙළ) විභාගයේ Z ලකුණ මත පදනම්ව උපාධි පාඨමාලා 07 ක් සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමට සැලසුම් කර තිබිණි. අදාළ සිසුන්ගේ නාම ලේඛන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් ලබාදිය යුතු වන අතර විගණන විමසුමේ සඳහන් දිනය එනම් 2021.12.31 වන විටත් විශ්වවිද්‍යාලය වෙත එවා නොතිබිණි. කෙසේ වුවද, 2022.02.15 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මෙම විශ්වවිද්‍යාලයට සිසුන් 518 ක ගේ නම් ඇතුලත් නාම ලේඛනයක් යොමු කර තිබිණි. එහි ඇතුළත් සිසුන් සංඛ්‍යාව පහත පරිදි වේ.

2

| | |
|---|---|
| දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය | 346 |
| දේශීය සමාජීය විද්‍යාව සහ කළමනාකරණ අධ්‍යයන පීඨය | 68 |
| දේශීය වෛද්‍යවිද්‍යා පීඨය | 104 |

මෙම නව පීඨවල ඉගැන්වීම් කටයුතු 2022.03.21 දින සිට මාර්ගගත ක්‍රමයට සිදු කරනු ලැබේ.

එසේ මාර්ගගත ක්‍රමයට ඉගැන්වීම් ආරම්භ කිරීමට පෙර එම උපාධිපාඨමාලා ආරම්භක කටයුතු රැසක් සිදු කළ යුතු අතර ඒ සඳහා කාර්යමණ්ඩල බඳවා ගැනීම සිසුන් බඳවාගැනීමට ප්‍රථමයෙන් අනිවාර්යයෙන් සිදු කලයුතු වේ. ඒ අනුව, නව පීඨ 2 හි ආරම්භක කටයුතු වශයෙන් කාර්යය මණ්ඩලය විසින් පහත සඳහන් කටයුතු සිදු කර ඇත.

- නව උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ඇතිව විෂයය නිර්දේශ සකස් කිරීම
- අලුතෙන් බඳවාගත් අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා කාර්යය මණ්ඩලසංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- නව පීඨ සඳහා අවශ්‍ය කාර්යාල ඉඩ කඩ හා දේශන ශාලා යනාදිය අවශ්‍ය පරිදි සැකසීම
- විද්‍යාගාර ස්ථාපනය කිරීමට හා උපකරණ මිළදී ගැනීමට අවශ්‍ය සැලසුම් හා පිරිවිතර සැකසීම , අවශ්‍ය තාක්ෂණි ඇගයීම් සිදු කිරීම
- අධ්‍යයන කාර්යය මණ්ඩලයේ කාර්යය සාධන කටයුතු ඇගයීම උදෙසා internal quality assurance scheme සැකසීම
- විදේශ උසස් අධ්‍යාපන ආයතන සමග සහයෝගීතා වැඩකටයුතු වෙනුවෙන් අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම සහ එකී කටයුතු ශක්තිමත් කිරීම
- නව උපාධි පාඨමාලා සඳහා අවශ්‍ය study materials (cause wise study guides development by way of learning aids for undergraduates)

(ආ) මෙම මුදල විශ්වවිද්‍යාලය පිහිටුවා යටිතල පහසුකම් සැපයීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කරන තෙක් කෙටිකාලීනව ආයෝජනය කර තිබුණි. 2022 වසරේදී එයට අදාළ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කළ අතර, ඒ අනුව මිල දී ගත් භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමට එම ආයෝජන නිදහස් කර, ගෙවීම් සිදුකර ඇත.

(ඇ) 2020 වසරේදී මෙන්ම 2021 වසරේදී ද රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නිසි පරිදි හා අපේක්ෂිත වූ පරිදි අධ්‍යයන කටයුතු හෝ ශිෂ්‍ය කටයුතු සිදු කිරීමට නොහැකි විය. එම නිසා මෙම අරමුදල් මගින් සිදු කිරීමට අපේක්ෂා කරන ලද කාර්යයන් ඉටු කරගැනීමට නොහැකි විය. නමුත්, 2022 වසරේ මේ වන විට ඊට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතින අතර, ඉදිරියේදී එම අරමුදල් භාවිතයට ගැනීමට අපේක්ෂිත වේ.

(ඈ) මෙම විශ්වවිද්‍යාලයේ සිව් මහල් අධ්‍යානාංශ ගොඩනැගිල්ල ඉදිකිරීම S.M.A. කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත 2014.09.10 වෙනි දින පවරන ලද අතර 2016.03.03 දින වැඩ අවසන් කිරීමට නියමිත විය. එහෙත් අදාල කොන්ත්‍රාත් සමාගමේ හිමිකරුගේ හදිසි වියෝව හේතුවෙන් කොන්ත්‍රාත්කරුට නියමිත දිනට ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීමට නොහැකි විය. ඉන් පසු එම ආයතනයේ ඇතිවූ අභ්‍යන්තර ආරාවුල් තත්ත්වය හේතුකොටගෙන කොන්ත්‍රාත්කරු විසින් 2018.03.19 දින ලිපියක් මගින් මෙම කොන්ත්‍රාත්තුව අවසන් කරන බවට දන්වා එවා කොළඹ වාණිජ මහා අධිකරණයේ නඩුවක් පැවරීමට කටයුතු යොදා ඇත. මෙම නඩු කටයුතු හේතුවෙන් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා තිබූ අතර 2020.05.29 දින දෙපාර්ශවයේම එකඟතාවය පරිදි ඉටු කරනු ලැබූ වැඩ කොටස් සඳහා පමණක් අදාල ගෙවීම් කිරීමෙන් අනතුරුව

3

S.M.A. කන්ස්ට්‍රක්ෂන් ආයතනය ඉදිකිරීම් කටයුතු වලින් ඉවත් වන ලදී (Contract Terminated with Mutual Agreement). ඒ අනුව අදාළ ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුව වෙනත් කොන්ත්‍රාත්කරුවන්ලවා ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කටයුතු කර ගැනීමට 2021.7.15 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව වහලය තැනීම හා අභ්‍යන්තර ගොඩනනැගිල්ලේ ඉතිරි වැඩ ලෙස කොන්ත්‍රාත් දෙකකට පිරිනමන ලදී .

ඉන් අනතුරුව වහලය ඉදිකිරීමේ වැඩ කටයුතු එස්. ඩී. එස් කොන්ත්‍රාත් සමාගම මගින් 2020.12.24 දින ආරම්භ කර 2021.04.10 වෙනි දින අවසන් කරන ලදී. ගොඩනනැගිල්ලේ ඉතිරි වැඩ කොන්ත්‍රාත්තුව තිස්ස බිල්ඩර්ස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත 2020.12.14 දිනැති ලිපියෙන් පවරන ලද අතර 2021.01.06 දින කොන්ත්‍රාත් වැඩ ආරම්භ කර 2021.12.03 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. නමුත් රටේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය මත 2020 හා 2021 වර්ෂවල රජය විසින් ඇදිරි නීතිය , සංචරණ සීමා පැණවීම හා එම තත්ත්වය මත පැවති ඉදිකිරීම් අමුද්‍රව්‍ය හිඟකම වර්තමාන රටෙහි පවතින ආර්ථික අර්බුධකාරී තත්ත්වය මත එදිනට ඉදිකිරීම් වැඩ අවසන් කිරීමට නොහැකි වුවද 2022 අගෝසතු මස වන විට ඉදිකිරීම්වල ප්‍රගතිය ආසන්න වශයෙන් 95% ක් පමණ වේ.

පහත පරිදි, 2022 අගෝස්තු මස වන විට සිව් මහල් අධ්‍යයන ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු සඳහා වැය වී ඇති මුදල රු. මිලියන 129.75 ක් වේ.

| ඉදි කිරීම් අදියර | ඇස්තමේනතු ගත මුදල (රු. මි.) | වැයවූ මුදල (රු. මි.) |
|---|---|---|
| I අදියර | 98.3 | 55.0 |
| II අදියර - වහල ඉදිකිරීම | 8.87 | 5.19 |
| II අදියර - ඉතිරි වැඩ | 86.15 | 69.56 |
| **2022 අගෝස්තු දක්වා ගෙවා ඇති මුළු මුදල** | | **129.75** |

මෙම ගොඩනැගිල්ලේ ඉදිකරීම සඳහා උපදේශක සේවා සපයන ආයතනය වෙත ගිවිසුම් ප්‍රකාරව රු.4,247,208.96 ක මුදලක් ගෙවා ඇති අතර ඒම ආයතනය විසින් ඉදිකිරීම් සඳහා ප්‍රමාණ පත්‍ර සකස් කිරීමේ සිට විවිධ අදියර වලදී අවශ්‍ය වූ උපදේශන සේවා සපයා ඇත.

මහාචාර්ය රංජන ඩබ්ලිව් සෙනෙවිරත්න
උපකුලපති
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

4